අධ්‍යාපන අමාත්‍යාංශය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය
கல்வி அமைச்சு
திறன்கள் அபிவிருத்தி, தொழில்கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க பிரிவு
Ministry of Education
Skills Development, Vocational Education, Research and Innovation Division

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
தேசிய பயிலுநர் மற்றும் கைத்தொழில் பயிற்சி அதிகாரசபை
National Apprentice & Industrial Training Authority













2023

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

971. ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
971, ஸ்ரீ ஜயவர்த்தனபுர மாவத்தை,வெலிக்கடை, இராஜகிரிய.
971, Sri Jayawardanapura Mawatha, Welikada, Rajagiriya

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2023

පටුන...

සභාපතිතුමාගේ පණිවිඩය	01
දැක්ම හා මෙහෙවර	02
අධිකාරියේ අරමුණ	03
අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	03
හැඳින්වීම	04
පාලක මණ්ඩලය	05
අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්	06
දිස්ත්‍රික් කළමනාකරුවන්	07
පරිපාලන ව්‍යුහය	08
දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	09 - 26
විශේෂ වැඩසටහන් හා තොරතුරු	27 - 28
2024 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක	29
කාර්ය මණ්ඩල තොරතුරු	30
අවසන් ගිණුම් වාර්තා	31 - 42
විගණන කමිටු වාර්තාව - 2023	43 - 45
විගණකාධිපති වාර්තාව	46 - 55

සභාපතිතුමාගේ පණිවුඩය.....

2023 වර්ෂය වන විටදී වසර 52 ගමන් මඟක් පසුකරමින් පැමිණි ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තම විෂය පථය පුළුල් කරගනිමින් 2023 වර්ෂය ආරම්භයත් සමඟ දිවයිනපුරා විසිරී පවතින දිස්ත්‍රික් කාර්යාල සියල්ල ආවරණය වන අයුරින් NVQ - 3 කෙටි කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් 3000ක් බඳවා ගැනීමේ විශේෂ වැඩසටහන සාර්ථකව මෙම වසර තුළදී ක්‍රියාත්මක විය.

මෙම වසර තුළ දී ආධුනිකත්ව පුහුණුව පිළිබඳ දැනුවත් කරමින් නයිටා නාමය ලංකාව පුරා ප්‍රචලිත කිරීමේ අරමුණින් ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් දියත් කරන ලදී. එමෙන්ම සියලුම දිස්ත්‍රික් තුළ සාර්ථකව NVQ පාඨමාලා නිමකල තරුණ තරුණියන් උදෙසා දිස්ත්‍රික් මට්ටමින් සහතික පත් ප්‍රදානයන් පවත්වමින් ඔවුන් ඇගයීමට ලක්කිරීම මෙම වසර තුළදී සිදුවිය.

එමෙන්ම මෙම වර්ෂයේදී අප ආධුනිකයින් වෙත පුහුණුව සලසනු ලබන අපගේ ව්‍යාපාරික ප්‍රජාව ඇගයීමේ සංකල්පය යටතේ එහි පළමු අදියර මහනුවර දිස්ත්‍රික්කය තුල NAITA සමඟ නිපුනතා සංවර්ධනය වෙනුවෙන් කැපවෙන සියළු පෞද්ගලික හා රාජ්‍ය ආයතන වෙනුවෙන් ඇගයීමේ සැදැවක් මහනුවර ස්විස් හෝටල් පරිශ්‍රයේදී පැවැත්විය. මෙම වසර තුළ RPL ක්‍රමවේදය මඟින් උතුරු පළාතේ කෘෂි කර්මාන්ත, ධිවර සහ කර්මාන්ත යන ක්ෂේත්‍රවල අවසන් වෘත්තීය පරීක්ෂණය සමත් 575 දෙනකු වෙත මෙවර NVQ සහතිකපත් ලබාදීම සිදුවිය.

2023 වසරෙහි විශේෂිත ක්‍රියාකාරකම් ලෙස ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද S4IG වැඩසටහන මඟින් ස්ථාපිත කරන ලද වෘත්තීය සූපවේදී පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු මධ්‍යස්ථානය නිල වශයෙන් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙනුවෙන් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදීම මෙම වසරෙහි සුවිශේෂී කටයුත්තක් විය.

යුධ හමුදාව සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය එක්ව මෙරට වෘත්තිය අධ්‍යාපනය නංවාලීම උදෙසා සාමූහික වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ මූලික අදියර දියත් කිරීම ආරම්භ කිරීම, මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා" (Diploma in Software Engineering) පාඨමාලාවේ සමාරම්භක කටයුතු ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කිරීම, විදෙස්ගත වීමට අපේක්ෂිත සහ විදෙස් රටවල සිට පැමිණි තරුණ තරුණියන්ගේ නිපුණතාවයන් ඉහළ නැංවීමේ අරමුණෙන් ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL), ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (NAITA) එක්ව ආරම්භ කරන ලද "Basic Skills for Hospitality Sector through Work Based Learning" පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කළ ආධුනිකයන් සඳහා සහතිකපත් ප්‍රදානය, දැනට අප ආයතනය හා කොළඹ නැව් තටාකාංගන සමාගමත් (Colombo Dockyard) එක්ව දැනට පවත්වාගෙන යන පෑස්සුම්කරු පාඨමාලාව ජාත්‍යන්තර ශ්‍රම වෙළඳ පොළ ඉල්ලුමට සරිලන අයුරින් ගුණාත්මක භාවය පවත්වාගෙන යෑමේ අරමුණින් ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම සිදු කිරීම වැනි සුවිශේෂී වැඩසටහන්වල මූලික අදියර ආරම්භ කිරීම මෙම වසරෙහි සාර්ථක ලෙස ක්‍රියාත්මක කරන ලදී.

එමෙන්ම මෙම වසරෙහි යෙදී තිබුණු 52 වන සංවත්සරය වෙනුවෙන් සියලුම දිස්ත්‍රික් කාර්යාලවල දානමය පිංකම්, විවිධ ප්‍රසංග ආදී සැමරුම් වැඩසටහන් පවත්වමින් මෙම වසර අවසානයේ සාර්ථකව නිම කරන ලද අතර , මෙම වර්ෂය තුළ බාධක හා අභියෝග හමුවේ නොසැලී ආයතනික අරමුණු වෙත ළඟාවීමට නිබඳව ඇප කැපවූ මාගේ සහෘද කාර්ය මණ්ඩලයට මෙන්ම අපගේ ආධුනිකයින් වෙත පුහුණු අවස්ථා සලසාදුන් රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශ ආයතන වෙත මාගේ ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් ලෙස සලකමි.

ඩබ්. රුවික අමරසේකර
සභාපති

දැක්ම

මානව සම්පත් සංවර්ධනය මඟින්

ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින් කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම

මෙහෙවර

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම

අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාළ පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාළව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රදානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාළ කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධ වී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, ජාතික ආයතන 03ක් සහ දිවයිනපුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හී ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාළ පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාළ ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම.

හැඳින්වීම

ආයතනික පාලන වාර්තාව

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාළ සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුළත් තොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2023 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25හි කළමණාකරුවන් හා ජාතික ආයතන වල ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

මෙහෙයුම් ක්‍රියාවලිය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත අනුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියට ලැබී ඇති බලතල අනුව එම පනතෙහි අංක 37(1) දරන ඡේදයේ ප්‍රකාරව සකස් කළ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අධිකාරිය තම මෙහෙයුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සඳහා පුහුණු සංකල්ප යටතේ ජාතික ආයතන 03ක්, දිස්ත්‍රික් කාර්යාල 25ක්, පුහුණු අනුබද්ධ ආයතන හා අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශ දායක කරගත් කර්මාන්ත ආශ්‍රිත පුහුණුව ලබාදීම සිදු කරයි.

පුහුණුව සඳහා බඳවා ගැනීම, සුපරීක්ෂණය, අධීක්ෂණය, සහතිකකරණය ආදී අංශ ගණනාවක් යටතේ සෘජුවම පුහුණු මෙහෙයුම් කටයුතු සිදු වේ. ඊට අමතරව කළමනාකරණය හා පරිපාලනය, සේවක පුහුණුව, යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍ය හා විගණනය ඊට ඇතුළත් වේ.

පාලක මණ්ඩලය

01. රුවික අමරසේකර මහතා,
සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

02. එස්. එච්. හරිස්චන්ද්‍ර
උප සභාපති
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

03. ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා,
අධ්‍යක්ෂ ජනරාල්
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
අංක 354/2, ඇල්විටිගල මාවත
කොළඹ 05

04. නෙවිල් අබේරත්න මහතා
ජනාධිපති නීතිඥ
අංක 137, නාගහවත්ත පාර
දළුගම, කැලණිය

05. ඩී. ආර්. සෝමවර්ධන මහතා
කථිකාචාර්ය 1 ශ්‍රේණිය – ICBT Campus
අංක 345/12, 3 වැනි හරස් වීදිය
කෝට්ටේ පාර

06. ආචාර්ය කාංචන සිල්වා
''ජනහිරු''
නීතිඥ
අංක 129/8 බී,
අනගාරික ධර්මපාල මාවත
මහනුවර

07. ඒ.සිදත් රෝහණ වෛද්‍යසේකර මහතා
අධ්‍යක්ෂ (ව්‍යාපෘති)
තිරසාර සංවර්ධන සමාගමේ
උපදේශකවරුන්ගේ (පුද්ගලික) සංගමය
අංක 788/1/ඒ, 3 වන පටුමග
මුවන්හැලවත්ත
මාලඹේ

08. කේ.ජී.විමලසේන මහතා
විශ්‍රාමික විදුහල්පති - ධර්මපාල විද්‍යාලය,
පන්නිපිටිය
අංක 262/1ඒ, පන්සල පාර
තලපත්පිටිය
නුගේගොඩ

09. පරාක්‍රම ජේ.කේ.එස්.ඩබ්ලිව්. වික්‍රමසිංහ මහතා
ජනාධිපති ඔම්බුඩ්ස්මන්
අංක 32, ගල්මඩුවවත්ත
කුණ්ඩසාලේ

10. අයි.එස්.එන්.පෙරේරා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (ගිණුම්කරණය සහ බදු)
ලංකා බැංකුව
ප්‍රධාන කාර්යාලය, කොළඹ 01

11. නිපුන් සමරතුංග මහතා
නීතිඥ
9/49, සමන් මාවත,
ගලවිලවත්ත, හෝමාගම

12. සම්පත් ත්‍රිමාවිතාන මහතා,
අධ්‍යක්ෂ (මානව සම්පත් ප්‍රධානී - ශ්‍රී ලංකාව)
වර්ච්සා පුද්ගලික සමාගම,
752 ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09

13. එම්. කේ. එස්. ජයසේන මිය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය


14. ආචාර්ය එම්. යූ. අයි අලහකෝන්
අධ්‍යක්ෂ (සංවර්ධන සහ නවෝත්පාදන)
අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්

රුවික අමරසේකර මහතා	සභාපති
එස්. එච්. හරිස්චන්ද්‍ර මහතා	උප සභාපති
ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්. විජේසිංහ	අධ්‍යක්ෂ ජනරාල්
පී.ආර්. රොද්‍රිගෝ මහතා	අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
සුමේධ ජයසිංහ මහතා	අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
ඩබ්ලිව්.එම්.ඒ.කේ. වීරසේකර මහතා	අධ්‍යක්ෂ (මුදල්)
ජී.එච්.වී.එන්.ඩබ්. ද සිල්වා මහතා	අධ්‍යක්ෂ (පුහුණු) වැ.බ./නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු)
සී.පී. සුබසිංහ මහතා	අධ්‍යක්ෂ (තත්ත්ව) වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තොරතුරු නිලධාරී (තොරතුරු දැනගැනීමේ පනත)
එන්.ඩබ්ලිව්.එන්. සඳමාලි මහත්මිය	අභ්‍යන්තර විගණක (2023.01.02 දින සිට 2024.01.01 දක්වා වැටුප් රහිත නිවාඩු)
එස්.වී.පී. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්)
ඩබ්ලිව්.ඒ.කේ.එස්. කුමාර මහතා	සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු)
ඒ.ජේ. පතිරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
එම්.එල්.පී. ප්‍රනාන්දු මහතා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා අලෙවි)
පී.පී. සුනිල් මහතා	සහකාර අධ්‍යක්ෂ (NSS) 2023.12.27 දින විශ්‍රාම යන ලදී
ආර්.ඩබ්.එම්.ඒ.ජේ. රත්නායක මහතා	සහකාර අධ්‍යක්ෂ (පර්ෂද)
යූ.එම්. ප්‍රබෝෂිනී මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා පාලන)
එන්.ඩී.පී. උස්ගොඩාරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා සැපයුම්)
ඒ.එච්.එස්.පී. විජේරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
කේ.ඒ.එස්.එස්.ජයසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (විශේෂ කාර්යස්ථ පුහුණු)
එච්.එම්.බී.ඒ.කේ.විජේරත්න මහත්මිය	සහකාර අධ්‍යක්ෂ (සහතික)
එස්.කේ. වික්‍රමආරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) වැ.ආ. පුහුණු නිලධාරී - ශ්‍රේණිය III
ඩී.ආර්. සපුතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - IET
එච්.ඒ.එන්.ඩී. කුමාරි මහත්මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති සහකාර අධ්‍යක්ෂ (නඩත්තු හා සිවිල්) වැ.ආ. (2023.08.31 දින දක්වා) අංශ ප්‍රධානී (උසස් අධ්‍යාපන) 2023.06.20 දින දක්වා
එම්.එච්.එන්.පී.ධර්මසිරි මහතා	අධ්‍යක්ෂ / විදුහල්පති (වැ.ආ.) - IETI නියෝජ්‍ය විදුහල්පති
ඩී.එල්.ඒ.කේ.දිසානායක මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති (වැ.ආ.) - AETI පුහුණු නිලධාරී - ශ්‍රේණිය II


දිස්ත්‍රික් කළමනාකරුවන්

එස්.ඩී.අබේවික්‍රම මහතා	හම්බන්තොට
වයි.එස්.ජයතිස්ස මහතා (වැ.බ.)	කොළඹ
එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණාරත්න මහතා	කොළඹ ((2023.05.31 දින දක්වා) කළුතර (2023.06.01 දින සිට)
ටී.ජී.එස්. ජයලත් මහතා	කළුතර (2023.06.01 දින සිට ප්‍රධාන කාර්යාලය වෙත මාරු කරන ලදී)
යූ.එම්.කේ.නානායක්කාර මහතා	මාතර 2023.03.01 දින විශ්‍රාම යන ලදී
ඩබ්.ඒ.කේ.චන්ද්‍රකුමාර මහතා (වැ.ආ.)	මාතර
පී.කේ.පී.ගුණවර්ධන මහතා	බදුල්ල
පී. නාරන්ගොඩ මහතා	ගාල්ල
බී.එම්.ජේ.එස්.කේ. රණාරාජා මහතා	කෑගල්ල
එස්.ඒ.එස්.එම්. සලීම් මවුලානා මහතා	මඩකලපුව
එස්. පී. සී.ජේ. මෛත්‍රීදාස මහතා	මොණරාගල
ආර්.එම්.එන්.එස්.කේ. රත්නායක මහතා	පුත්තලම
ආර්.තිරුමුරුඛන් මහතා (2022.08.01 දින සිට)	යාපනය
එස්.සිවගෞරි මිය	මුලතිව්
කේ.කේ. නිශ්ශංක මිය	කුරුණෑගල
ඕ.කේ.පී.ඒ.සමන් කුමාර මහතා	මහනුවර
අයි.එම්.යූ.එස්.කේ. ඉලංගකෝන් මිය	මාතලේ
එස්.එස්. සෙනෙවිරත්න මහතා	අනුරාධපුර
පී.ආර්. කුමාරසිංහ මහතා	ගම්පහ
එස්. සුහාෂ් මහතා	කිලිනොච්චි
වයි.එස්.පියතිලක මහතා	රත්නපුර
කේ.පත්මනාදන් මහතා	ත්‍රිකුණාමලය
ඩී.ඒ.ඩී.සූරියබන්ඩාර මහතා (වැ.ආ.)	නුවරඑළිය
එම්.සී.එම්.අබේසුන්දර මහතා	අම්පාර
වයි.යෝකේස්වරන් මහතා (වැ.ආ.)	වව්නියාව
එස්.තීපන් මහතා (වැ.ආ.)	මන්නාරම


National Apprentice & Industrial Training Authority
Organizational Structure
Board Of Management
Chairman /CEO
Vice Chairman
Director General
Director Admin. & H.R.
Director Training
Institutes/ Districts
Director Quality
Director Planning & Monitoring
Director Finance
Internal Auditor
I.A.O
A.D. Admin
VRU Officer
Proc. Officer
Trp. Officer
M.A.
Drivers
A.D. Maint.& Civil .
Tech. Officer
Dft.M. M.A.
M.A.
A.D. HRM
A.O.
Transl ator.
M.A.
A.D. HRD
T.O.
Office Aide
A.D. Training Service
A.D. Training
A.D. Cluster
A.D. SIT
A.D. OJT
A.D. C.G.& Marketing
A.D. Quality
A.D. NSS
A.D. Assess ment
A.D. Certifi cate
A.D. Information Systems
A.D. Planning & Develop.
A.D. Monito ring
A.D. Acc. & Controll
T.O.
Inspec
Inspec.
Q.A. Off.
Sys. Adm
D.B Adm
Stat. cian
Acct. Officer
B/ Sec Leg.Off
Management Asst.
Book Keeper

දත්ත නිරූපණය සහ විශ්ලේෂණය

ප්‍රස්ථාරය 1 ඃ පුහුණු කිරීමේ කාර්යන්හි සාරාංශය (වසර 10ක් තුළ)



පසුගිය වසර 10ක් තුල ආයතනික බඳවා ගැනීම, පුහුණුව හැර යාම.පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුවේ නිරත වීම පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයක් ඉහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. ආයතනික බඳවා ගැනීම සලකා බලන විට පෙර වසර වලදී එහි අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළත් කොරෝනා වියසනයත් සමඟ 2020 හා 2021 වසර තුලදී සීඝ්‍ර අඩු වීමක් පෙන්නුම් කරයි. කෙසේ නමුදු නැවතත් බඳවා ගැනීම්වල සීඝ්‍ර වර්ධනයක් කරා ළඟා වීමට මෙම වසරේ දී හැකි විය. ආධුනිකයින් පුහුණුව හැර යාම පෙර වසර වලට සාපේක්ෂව සාමාන්‍ය මට්ටමක පවතී. ආධුනිකයින් පුහුණුව සම්පූර්ණ කිරීම සහ පුහුණුවේ නිරත වෙමින් පැවතීම පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කරයි.

වගුව 1 : මධ්‍යස්ථාන, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව හා ජාතික ආයතනවල ආධුනිකයින් ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය නිරූපණය

පුහුණු වර්ගය		ඉලක්ක	බඳවාගැනීම්	බඳවාගැනීම් ප්‍රතිශතය
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව				
ජාතික වෘත්තීය සුදුසුකම		15,000	19,680	**131.2%**
කර්මාන්ත ශිල්පී		3,500	1,170	**33.4%**
ස්ථානානුරූපී		550	774	**140.7%**
ග්‍රාමීය මට්ටම		220	477	**216.8%**
විශේෂ පුහුණුව (ASTA, බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		860	65	**7.6%**
13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන		800	1,542	**192.8%**
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව				
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම	3,290	2,345	**71.3%**
	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	590	248	**42.0%**
අර්ධ කාලීන		2,650	786	**29.7%**
ජාතික ආයතන				
පූර්ණ කාලීන		1,500	1,251	**83.4%**
අර්ධ කාලීන		1,850	1,760	**95.1%**
වෙනත්				
විශේෂ කර්මාන්ත පුහුණුව		10,000	13,880	**138.8%**
රැකියාස්ථ පුහුණුව		15,000	7,248	**48.3%**
එකතුව		**55,810**	**51,226**	**91.8%**

සමාලෝචිත වර්ෂය තුළ විවිධ පුහුණු පාඨමාලා සඳහා ආයතනික බඳවා ගැනීම ආයතනය විසින් අරමුණු ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මෙමඟින් නිරූපණය කෙරේ.

මෙම වසරේ 51226ක් වූ මුළු ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගනිමින් 91%ක ඉලක්කයක් සම්පූර්ණ කරගැනීමට හැකි විය. එහිදී සමස්තයක් වශයෙන් බොහෝ පුහුණු පාඨමාලා සඳහා 50%කට වඩා වූ අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට හැකි වී ඇති බව නිරූපණය වේ. කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ජාතික වෘත්තීය සුදුසුකම සඳහා අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ බඳවා ගැනීමක් සිදු කිරීමට හැකි විය.

වගුව 2 : පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය පෙර වර්ෂය හා සැසඳීම

2023		බඳවාගැනීම්		පුහුණුව හැරයාම්		පුහුණුව සම්පූර්ණ කිරීම්		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2022	2023	2022	2023	2022	2023	2022	2023
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව									
ජාතික වෘත්තීය සුදුසුකම		13,931	19,680	3,798	4,983	5,301	11,721	12,974	15,950
කර්මාන්ත ශිල්පී		2,736	1,170	837	599	1,686	1,804	3,543	2,310
ස්ථානානුරූපී		1,093	774	217	171	913	778	698	523
ග්‍රාමීය මට්ටම		510	477	138	83	408	346	216	264
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර, ආබාධිත පුද්ගලයන්)		167	65	47	8	459	112	70	15
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව									
පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම	2,678	2,345	427	329	2,057	2,202	2,557	2,371
	ජාතික වෘත්තීය සුදුසුකම නොවන	245	248	79	43	188	272	208	141
අර්ධ කාලීන		391	786	3	-	319	786	111	111
ජාතික ආයතන									
පූර්ණ කාලීන		1,269	1,251	315	418	1,100	730	2,779	2,882
අර්ධ කාලීන		983	1,760	1	238	809	1,487	167	202
එකතුව		**24,003**	**28,556**	**5,862**	**6,872**	**13,240**	**20,238**	**23,323**	**24,769**
වෙනත්									
විශේෂ කර්මාන්ත පුහුණුව		13,561	13,880	-	-	8,812	9,182	7,312	12,010
රැකියාස්ථ පුහුණුව		9,797	7,248	1,286	678	6,687	4,696	1,603	3,477
මුළු එකතුව		**47,361**	**49,684**	**7,148**	**7,550**	**28,739**	**34,116**	**32,238**	**40,256**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

විවිධ පුහුණු ක්‍රමවේදයන් තුළ පුහුණු කිරීම් කාර්යයන්හි ප්‍රගතිය සංසන්දනය ඉහත වගුව මඟින් නිරූපණය වේ. එහිදී 49684ක් වූ සමස්ත ආධුනික බඳවා ගැනීමක් සිදු කරමින් 5%ක වර්ධනයක් පෙර වසරට සාපේක්ෂව පෙන්නුම් කෙරේ. පෙර වසර හා සැසඳීමේදී පුහුණුව හැරයාමෙහි සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. පුහුණුව සම්පූර්ණ කිරීම ගත්කළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීම පෙර වසරට සාපේක්ෂ 19%කට ආසන්න වර්ධනයකි. 2022 වසර වන විට 32238ක් පුහුණුවෙහි නිරත වෙමින් සිටිය අතර 2023 වසර අවසන් වන විට 40256ක ආධුනිකයින් සංඛ්‍යාවක් අප ආයතනය තුළ විෂය පාඨමාලාවන්ට අදාලව ආධුනිකත්ව පුහුණුව ලබමින් සිටී.

සමස්තයක් ලෙස 2022 වසර සමඟ සැසඳීමේදී 2023 වසර අදාල ඉලක්කයන් සපුරා ගනිමින් සාර්ථක ආධුනිකත්ව පුහුණුවක් ආධුනිකයන් හට ලබාදුන් වසරක් ලෙස සැලකිය හැක.


වගුව 3 : පුහුණු කිරීම් කාර්යයන්හි සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන්) 2023

2023	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	10,866	8,814	19,680	2,902	2,081	4,983	5,757	5,964	11,721	9,646	6,304	15,950
කර්මාන්ත ශිල්පී	584	586	1,170	303	296	599	671	1,133	1,804	1,566	744	2,310
ස්ථානානුරූපී	319	455	774	88	83	171	374	404	778	239	284	523
ග්‍රාමීය මට්ටම	6	471	477	2	81	83	24	322	346	-	264	264
විශේෂ පුහුණු වැඩසටහන (බන්ධනාගාර/ආබාධිත)	44	21	65	7	1	8	84	28	112	14	1	15
එකතුව	11,819	10,347	22,166	3,302	2,542	5,844	6,910	7,851	14,761	11,465	7,597	19,062
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව												
ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	793	1,552	2,345	168	161	329	620	1582	2,202	820	1,551	2,371
ජාතික වෘත්තීය සුදුසුකම නොවන (Non NVQ)	4	244	248	5	38	43	3	269	272	8	133	141
අර්ධ කාලීන	202	584	786	-	-	-	204	582	786	28	83	111
එකතුව	999	2,380	3,379	173	199	372	827	2,433	3,260	856	1,767	2,623
ජාතික ආයතන												
පූර්ණ කාලීන	1,093	158	1,251	360	58	418	594	136	730	2,442	440	2,882
අර්ධ කාලීන	1,608	152	1,760	191	47	238	1,420	67	1,487	154	48	202
එකතුව	**2,701**	**310**	**3,011**	**551**	**105**	**656**	**2,014**	**203**	**2,217**	**2,596**	**488**	**3,084**
වෙනත්												
විශේෂ කර්මාන්ත පුහුණුව	9,652	4,228	13,880	-	-	-	5,658	3,524	9,182	8,314	3,696	12,010
රැකියාස්ථ පුහුණුව	4,691	2,557	7,248	361	317	678	2,581	2,115	4,696	2,245	1,232	3,477
එකතුව	14,343	6,785	21,128	361	317	678	8,239	5,639	13,878	10,559	4,928	15,487
මුළු එකතුව	**29,862**	**19,822**	**49,684**	**4,387**	**3,163**	**7,550**	**17,990**	**16,126**	**34,116**	**25,476**	**14,780**	**40,256**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.


සමාලෝචිත වර්ෂය තුළදී විවිධ පුහුණු ක්‍රමවේදයන් යටතේ ස්ත්‍රී පුරුෂභාවය අනුව ආධුනිකයින්ට පුහුණුවට බඳවාගැනීම, පුහුණුව හැරයාම, පුහුණුව සම්පූර්ණ කිරීම සහ තවදුරටත් පුහුණුවේ නිරත වීම ව්‍යාප්ත වී ඇති අයුරු වගුව මඟින් නිරූපණය වේ. 49684ක් වූ සමස්ත ආධුනික බඳවා ගැනීම මෙම වසරේදී සිදු කිරීමට හැකි වී ඇති අතර එයින් 29862ක් පිරිමි ආධුනිකයින් වන අතර 19822ක් කාන්තා ආධුනිකයින් වේ. එහිදී කර්මාන්ත පුහුණුව යටතේ කාන්තා සහ පිරිමි ආධුනික බඳවා ගැනීමෙහි සැලකිය යුතු වෙනසක් නොපෙනුනත් මධ්‍යස්ථ පාදක ආධුනිකයින් පුහුණු ක්‍රමවේදය යටතේ පිරිමි ආධුනිකයින්ගේ සහභාගිත්වය සැලකිය යුතු ලෙස අඩු වී ඇත. ජාතික ආයතන සඳහා මෙම වසරේ 3011ක් ආධුනිකයින් බඳවා ගෙන ඇත. 7550ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් පුහුණුව හැර ගොස් ඇති අතර 34116ක් පුහුණුව සාර්ථකව නිම කර ඇත. කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සඳහා කාන්ත ආධුනිකයින් බඳවා ගැනීම ප්‍රධාන අරමුණක් විය. එය යම්තාක් දුරට ඉටුකර ගැනීමට මෙම වසර තුල හැකියාව ලැබී ඇත.

ප්‍රස්ථාරය 2 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණුවට ඇතුලත් වීම



සමාලෝචිත වර්ෂය තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් ආධුනිකයින් බඳවා ගැනීම මෙම ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. එහිදී මුළු ආධුනිකයින්ගෙන් 60%ක් පිරිමි ආධුනිකයින් නියෝජනය කරන අතර 40%ක් කාන්තා ආධුනිකයින් වේ.

ප්‍රස්ථාරය 3 ඃ ජාතික ආධුනිකත්ව පුහුණුව ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) හා ජාතික වෘත්තීය සුදුසුකම නොවන (Non NVQ) (අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුව හැර)



2023 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) හා ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) පුහුණු කිරීම් යටතේ ආධුනිකයින් බඳවා ගැනීම ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. සමස්තයක් ලෙස ගත්කළ ජාතික වෘත්තීය සුදුසුකම යටතේ ආධුනිකයින් පුහුණු ක්‍රමවේදයන්ට අනුයුක්ත වීමට වැඩි නැඹුරුතාවයක් දක්වා ඇති බව ප්‍රස්තාරය මඟින් වටහා ගත හැක. එහිදී කර්මාන්ත පාදක පුහුණු ක්‍රමවේදය තුළින් 19680ක් වූ ආධුනිකයින් ජාතික වෘත්තීය සුදුසුකම යටතේ පුහුණු කිරීමට අප ආයතනය හා සම්බන්ධ වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් කළ 85%කි.

ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා ඉල්ලුම වැඩිවෙමින් පවතින බව මෙමඟින් නිරූපණය වේ.

වගුව 4 : ජාතික ආයතන වල ප්‍රගතිය (පූර්ණ කාලීන පාඨමාලා)

ජාතික ආයතන	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත	300	578	16	594	240	7	247	70	8	78	950	20	970
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද	700	382	59	441	78	31	109	231	53	284	678	58	736
ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක	500	133	83	216	42	20	62	293	75	368	814	362	1176
එකතුව	**1,500**	**1,093**	**158**	**1,251**	**360**	**58**	**418**	**594**	**136**	**730**	**2,442**	**440**	**2,882**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී ජාතික ආයතන තුන යටතේ ආධුනික බඳවා ගැනීම, පුහුණුව හැරයාම සහ පුහුණුව සාර්ථකව නිම කිරීම සහ පුහුණුවේ නවදුරටත් නිරත වීම වගුව මඟින් නිරූපණය කෙරේ. මෙම වසරේදී මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වැඩිම ආධුනික සංඛ්‍යාවත් බඳවා ගෙන ඇති අතර එය ජාතික ආයතන සඳහා බඳවා ගත් සමස්ත මුළු ආධුනික සංඛ්‍යාව වන 1251න් 47%ක ප්‍රමාණයකි. මෙම වසර තුල ජාතික ආයතන නව පාඨමාලා ආරම්භ කළ අතර විෂය මාලා නවීකරණය කිරීමක්ද සිදුකරන ලදී.

වගුව 5: කර්මාන්තගත හා මධ්‍යස්ථානගත පුහුණු කිරීම් සාරාංශය (අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුව හැර)

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	2,945	1,469	640	2,109	266	169	435	563	535	1,098	2,250	781	3,031
ගම්පහ	1,420	1,066	443	1,509	342	146	488	372	269	641	1,094	385	1,479
කළුතර	980	537	293	830	273	96	369	323	254	577	408	187	595
මහනුවර	1,090	722	566	1,288	220	170	390	386	482	868	695	372	1,067
මාතලේ	530	315	340	655	140	122	262	146	215	361	240	244	484
නුවරඑළිය	520	206	420	626	70	79	149	127	374	501	152	230	382
ගාල්ල	1,535	825	943	1,768	222	254	476	399	664	1,063	919	737	1,656
මාතර	1,360	759	852	1,611	174	178	352	321	606	927	742	719	1,461
හම්බන්තොට	920	445	572	1,017	65	92	157	360	558	918	304	398	702
යාපනය	950	315	538	853	69	124	193	280	429	709	316	449	765
මන්නාරම	555	87	296	383	1	-	1	209	144	353	140	380	520
වවුනියා	620	275	329	604	84	60	144	215	304	519	153	199	352
මුලතිව්	460	146	376	522	2	54	56	158	389	547	131	249	380
කිළිනොච්චි	685	217	389	606	46	42	88	217	313	530	171	246	417
මඩකළපුව	1,320	492	549	1,041	95	69	164	591	418	1,009	552	464	1,016
අම්පාර	1,060	736	487	1,223	118	46	164	606	376	982	696	359	1,055
ත්‍රිකුණාමලය	1,220	515	544	1,059	76	75	151	496	728	1,224	546	511	1,057
කුරුණෑගල	1,040	559	521	1,080	285	193	478	249	414	663	496	375	871
පුත්තලම	780	427	591	1,018	148	187	335	202	347	549	405	346	751
අනුරාධපුර	620	657	460	1,117	196	94	290	294	314	608	471	339	810
පොළොන්නරුව	650	267	144	411	49	31	80	154	112	266	166	105	271
බදුල්ල	655	335	532	867	117	134	251	168	319	487	227	372	599
මොණරාගල	470	258	243	501	56	74	130	207	241	448	150	115	265
රත්නපුර	930	550	699	1,249	180	166	346	280	613	893	578	433	1,011
කෑගල්ල	695	436	376	812	181	86	267	210	284	494	291	286	577
එකතුව	**24,010**	**12,616**	**12,143**	**24,759**	**3,475**	**2,741**	**6,216**	**7,533**	**9,702**	**17,235**	**12,293**	**9,281**	**21,574**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තගත හා මධ්‍යස්ථානගත පුහුණු කිරීම් සාරාංශය මෙමඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක 25න් බඳවා ගත් මුළු ආධුනිකයින් සංඛ්‍යාව 24759ක් වන අතර එය අපේක්ෂිත ඉලක්කගත බඳවා ගැනීම් අභිබවමින් ප්‍රතිශතයක් ලෙස 103% වේ. බඳවාගත් ආධුනිකයින් අතුරින් වැඩිම ආධුනික සංඛ්‍යාවක් බඳවා ගෙන ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙනි. පුහුණුව සම්පූර්ණ කළ මුළු ආධුනිකයින් ගණන 17235ක් වේ.

වගුව 6 : මධ්‍යස්ථාන පාදක පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	91	75	166	-	-	-	27	62	89	114	115	229
ගම්පහ	4	13	17	-	-	-	11	27	38	4	13	17
කළුතර	50	67	117	15	9	24	43	44	87	53	67	120
මහනුවර	128	33	161	29	7	36	116	66	182	138	32	170
මාතලේ	22	70	92	-	7	7	12	60	72	22	66	88
නුවරඑළිය	17	100	117	2	17	19	16	124	140	17	100	117
ගාල්ල	34	123	157	5	10	15	26	119	145	39	118	157
මාතර	1	56	57	-	4	4	6	82	88	1	68	69
හම්බන්තොට	34	86	120	9	27	36	25	113	138	30	54	84
යාපනය	16	28	44	1	2	3	15	59	74	14	27	41
මන්නාරම	-	-	-	-	-	-	-	39	39	-	-	-
වවුනියා	7	25	32	2	-	2	22	43	65	6	25	31
මුලතිව්			-			-			-			-
කිලිනොච්චි	73	88	161	20	4	24	44	95	139	73	88	161
මඩකළපුව	20	54	74	-	1	1	25	23	48	20	53	73
අම්පාර	8	153	161	-	-	-	-	105	105	8	62	70
ත්‍රිකුණාමලය	17	43	60	11	3	14	29	46	75	16	43	59
කුරුණෑගල	132	158	290	54	29	83	96	120	216	121	143	264
පුත්තලම	30	103	133	3	23	26	21	88	109	30	102	132
අනුරාධපුර	41	115	156	7	16	23	14	103	117	54	112	166
පොළොන්නරුව	7	34	41	-	1	1	9	38	47	7	33	40
බදුල්ල	33	83	116	13	17	30	12	67	79	29	79	108
මොණරාගල	1	33	34	-	4	4	21	65	86	1	32	33
රත්නපුර	17	126	143	2	5	7	17	144	161	17	126	143
කෑගල්ල	14	130	144	-	13	13	16	119	135	14	126	140
එකතුව	**797**	**1,796**	**2,593**	**173**	**199**	**372**	**623**	**1,851**	**2,474**	**828**	**1,684**	**2,512**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුවෙහි පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමේ සාරාංශය ඉහත වගුව මඟින් නිරූපණය කෙරේ. දිස්ත්‍රික්ක මට්ටමින් මධ්‍යස්ථාන පාදක පුහුණුව සැලකිමේදී වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගනිමින් කුරුණෑගල දිස්ත්‍රික්කය ඉදිරියෙන් සිටී. දිස්ත්‍රික්ක මට්ටමින් 2474ක් වූ ආධුනිකයින් සංඛ්‍යාවක් පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර ඇත.

වගුව 7 : කර්මාන්ත පාදක පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	1,378	565	1,943	266	169	435	536	473	1,009	2,136	666	2,802
ගම්පහ	1,062	430	1,492	342	146	488	361	242	603	1,090	372	1,462
කළුතර	487	226	713	258	87	345	280	210	490	355	120	475
මහනුවර	594	533	1,127	191	163	354	270	416	686	557	340	897
මාතලේ	293	270	563	140	115	255	134	155	289	218	178	396
නුවරඑළිය	189	320	509	68	62	130	111	250	361	135	130	265
ගාල්ල	791	820	1,611	217	244	461	373	545	918	880	619	1,499
මාතර	758	796	1,554	174	174	348	315	524	839	741	651	1,392
හම්බන්තොට	411	486	897	56	65	121	335	445	780	274	344	618
යාපනය	299	510	809	68	122	190	265	370	635	302	422	724
මන්නාරම	87	296	383	1	-	1	209	105	314	140	380	520
වවුනියා	268	304	572	82	60	142	193	261	454	147	174	321
මුලතිව්	146	376	522	2	54	56	158	389	547	131	249	380
කිලිනොච්චි	144	301	445	26	38	64	173	218	391	98	158	256
මඩකළපුව	472	495	967	95	68	163	566	395	961	532	411	943
අම්පාර	728	334	1,062	118	46	164	606	271	877	688	297	985
ත්‍රිකුණාමලය	498	501	999	65	72	137	467	682	1,149	530	468	998
කුරුණෑගල	427	363	790	231	164	395	153	294	447	375	232	607
පුත්තලම	397	488	885	145	164	309	181	259	440	375	244	619
අනුරාධපුර	616	345	961	189	78	267	280	211	491	417	227	644
පොළොන්නරුව	260	110	370	49	30	79	145	74	219	159	72	231
බදුල්ල	302	449	751	104	117	221	156	252	408	198	293	491
මොණරාගල	257	210	467	56	70	126	186	176	362	149	83	232
රත්නපුර	533	573	1,106	178	161	339	263	469	732	561	307	868
කෑගල්ල	422	246	668	181	73	254	194	165	359	277	160	437
එකතුව	**11,819**	**10,347**	**22,166**	**3,302**	**2,542**	**5,844**	**6,910**	**7,851**	**14,761**	**11,465**	**7,597**	**19,062**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්ත පාදක පුහුණුවෙහි දත්ත විශ්ලේෂණයන් ඉහත වගුව මඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක මට්ටමින් වැඩිම ආධුනිකයින් සංඛ්‍යාවක් බඳවා ගෙන ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයයි. ආධුනිකයින් 22166ක් දිස්ත්‍රික්ක මට්ටමින් බඳවා ගෙන ඇත. පුහුණුව සාර්ථකව අවසන් කළ ආධුනිකයින් සංඛ්‍යාව 14761කි. මෙම වසරතුල කැපී පෙනෙන වර්ධනයක් කර්මාන්ත පාදක පුහුණුකිරීම නිරූපනය කරයි.


වගුව 8 : අර්ධ කාලීන පාඨමාලා පුහුණුව

දිස්ත්‍රික්කය	බඳවා ගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			2023.12.31 දිනට පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ගම්පහ	6	18	24	-	-	-	6	18	24	-	-	-
කළුතර	7	38	45	-	-	-	25	74	99	-	-	-
මහනුවර	28	37	65	-	-	-	13	30	43	15	7	22
මාතර	3	21	24	-	-	-	2	15	17	3	21	24
වවුනියා	6	17	23	-	-	-	11	32	43	-	-	-
කුරුණෑගල	27	77	104	-	-	-	26	65	91	1	12	13
අනුරාධපුර	7	51	58	-	-	-	7	51	58	-	-	-
පුත්තලම	42	88	130	-	-	-	42	88	130	-	-	-
බදුල්ල	11	59	70	-	-	-	16	74	90	-	-	-
රත්නපුර	48	136	184	-	-	-	39	93	132	9	43	52
කෑගල්ල	17	42	59	-	-	-	17	42	59	-	-	-
එකතුව	**202**	**584**	**786**	**-**	**-**	**-**	**204**	**582**	**786**	**28**	**83**	**111**
කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය - කටුබැද්ද	632	103	735	36	16	52	525	60	585	71	27	98
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත	972	2	974	150	-	150	895	2	897	82	-	82
ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක	4	47	51	5	31	36	-	5	5	1	21	22
එකතුව	1,608	152	1,760	191	47	238	1,420	67	1,487	154	48	202
මුළු එකතුව	**1,810**	**736**	**2,546**	**191**	**47**	**238**	**1,624**	**649**	**2,273**	**182**	**131**	**313**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂවල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

දිස්ත්‍රික්ක මට්ටමින් හා ජාතික ආයතන තුළ පවතින අර්ධ කාලීන පාඨමාලා සඳහා අනුයුක්ත වූ ආධුනිකයින්ගේ පුහුණු වීම් හි සාරාංශය ඉහත වගුව මඟින් නිරූපණය වේ. දිස්ත්‍රික්ක 11ක් තුළ අර්ධ කාලීන පාඨමාලා පැවැත්වූ අතර මෙම වසරේදී දිස්ත්‍රික්ක මට්ටමින් ආධුනිකයින් 786ක් බඳවා ගෙන ඇත. ජාතික ආයතන තුනෙන් බඳවා ගත් ප්‍රමාණය 1760කි. දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණුව සම්පූර්ණ කළ ආධුනිකයින් ප්‍රමාණය 786 වන අතර ජාතික ආයතන තුළින් පුහුණුව සම්පූර්ණ කළ ආධුනිකයින් ප්‍රමාණය 1,487කි. මෙම වසර තුල ආයතනයේ ආදායම වැඩිකරගැනීම මූලික අවශ්‍යතාවයක්වූ බැවින් අර්ධ කාලීන පාඨමාලා බොහොමයක් දිස්ත්‍රික් මට්ටමින් හා ජාතික මට්ටමින් ආරම්භ කරන ලදී.


ප්‍රස්ථාරය 4 ඃ පැරටෝ විශ්ලේෂණය (මධ්‍යස්ථාන පාදක පුහුණු කිරීම)



මධ්‍යස්ථාන පාදක පුහුණුව තුළින් දිස්ත්‍රික්කයන් තුළ ආධුනිකයින්ගේ පාඨමාලා සඳහා ඇති ඉල්ලුම මෙම පැරටෝ විශ්ලේෂණ ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ.

එහිදී තොරතුරු තාක්ෂණය පාඨමාලාව සඳහා ඉහළ ඉල්ලුමක් ආධුනිකයින් තුළ පවතින බව හඳුනාගත හැක. තවද ප්‍රධාන වශයෙන් පරිගණක චිත්‍ර ශිල්පී, රූපලාවණ්‍ය ශිල්පී, මහන මැෂින් ක්‍රියාකරු, හෙද සහායක, පාඨමාලා සඳහා ද ආධුනිකයින් යොමු වීමේ වැඩි ප්‍රවනතාවයක් දක්නට ලැබේ.


ප්‍රස්ථාරය 5 ඃ පැරටෝ විශ්ලේෂණය (කර්මාන්ත පාදක පුහුණු කිරීම)



සමාලෝචිත වර්ෂයෙහි දිස්ත්‍රික්ක මට්ටමින් පවතින කර්මාන්ත පාදක පුහුණු කිරීම් පාඨමාලාවන් සඳහා පවතින ඉල්ලුමෙහි විචලනයක් මෙම ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ.

එහිදී ඇඳුම් මසන්නා පාඨමාලාව සඳහා වැඩි ඉල්ලුමක් පවතින අතර පෙර පාසල් ගුරු, මෝටර් රථ යාන්ත්‍රික ශිල්පී, සාත්තු සේවා යන පාඨමාලා සඳහා ද ආධුනිකයින් යොමු වීමේ ඉහළ නැඹුරු තාවයක් පෙන්නුම් කරයි.


ප්‍රස්ථාරය 6 ඃ පැරටෝ විශ්ලේෂණය (ජාතික ආයතන)



පැරටෝ විශ්ලේෂණය සහිත ඉහත ප්‍රස්ථාරය මඟින් ජාතික ආයතනයන්හි වැඩිම ඉල්ලුමක් පවතින පාඨමාලා පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ.


එහිදී මෝටර් රථ යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව සඳහා වැඩිම ඉල්ලුමක් නිරූපණය වේ.

ප්‍රස්ථාරය 7 ඃ රැකියාස්ථ පුහුණුව පෙර වර්ෂයන් සමඟ සැසඳීම



පෙර වර්ෂයන් තුළ රැකියාස්ථ පුහුණුවේ ආධුනික බඳවාගැනීමේ විචලනය ඉහත ප්‍රස්ථාරය මඟින් නිරූපණය වේ. මෙහිදී සිදුවනුයේ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ අනෙකුත් ආයතනතුල සිටිනා ආධුනිකයින්හට රැකියාස්ත පුහුණුව ලබා දීමයි. මෙම වසර තුල ආධුනිකයින් 7248කට අප ආයතනය මඟින් රැකියාස්ථ පුහුණුව ලබාදී ඇත.

ප්‍රස්ථාරය 8 ඃ යන්ත්‍රාගාර පුහුණුවේ ප්‍රගතිය පෙර වර්ෂයන් සමඟ සැසඳීම



පෙර වර්ෂයන් තුළ යන්ත්‍රාගාර පුහුණුවෙහි ආධුනික බඳවා ගැනීමෙහි ප්‍රගතිය ප්‍රස්ථාරය මඟින් නිරූපණය කෙරේ. මෙහිදී සිදුවනුයේ උපාධි අපේක්ෂිත හා ඩිප්ලෝමා අපේක්ෂිත සිසුන් සඳහා කර්මාන්ත පුහුණුව ලභාදීමයි. මෙම වසරතුල උපාධි අපේක්ෂිත හා ඩිප්ලෝමා අපේක්ෂිත සිසුන් 13880 කට අප ආයතනය මඟින් යන්ත්‍රාගාර පුහුණුව ලබාදී ඇත.

වගුව 9 : විභාග, ඇගයීම් සහ සහතික පත් නිකුත් කිරීම

සහතිකපත වර්ගය		පරීක්ෂණ පැවැත්වූ සංඛ්‍යාව		අවසන් වෘත්තීය පරීක්ෂණයෙන් සමත්වූ සංඛ්‍යාව		ලබාදුන් සහතිකපත් සංඛ්‍යාව	
		2022	**2023**	**2022**	**2023**	**2022**	**2023**
ජාතික වෘත්තීය සුදුසුකම	කර්මාන්ත පාදක	2,661	11,796	2,643	7,417	6,332	6,925
	මධ්‍යස්ථාන පාදක	2,534	2,542	2,532	2,146	2,128	3,216
	පෙර දැනුම පසු ඇගයීම	8,559	12,260	8,235	11,908	7,908	12,119
ජාතික ආයතන (ජාතික වෘත්තීය සුදුසුකම)		859	966	827	935	990	1,067
කර්මාන්ත ශිල්පී	මධ්‍යස්ථාන පාදක	139	197	113	156	-	2,058
	කර්මාන්ත පාදක	2,487	1,997	2,291	1,874	2,389	
ස්ථානානුරූපී		865	626	836	609	805	927
ග්‍රාමීය මට්ටම		307	261	299	259	382	361
විශේෂ කර්මාන්ත පුහුණුව(KDU/NDT/HND)		8,812	9,182	8,812	9,182	502	1,295
වෙනත් (NCICT/NDICT/CELV/SLCCL/NTT/ED/Part Time NI/Other)		1,074	4,451	820	3,822	992	3,714
බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය						33,138	1,486
එකතුව		**28,297**	**44,278**	**27,408**	**38,308**	**55,566**	**33,168**

ඉහත වගුව මඟින් පරීක්ෂණ කටයුතු සිදු කිරීම, විභාග පැවැත්වීම සහ සහතික පත් නිකුත් කිරීම පිළිබඳව සංක්ෂිප්ත විශ්ලේෂණයක් නිරූපණය කෙරේ. එහිදී අවසන් වෘත්තීය පරීක්ෂණය සඳහා ආධුනිකයින් 44278 ක් සහභාගි වී ඇති අතර ඒ අතුරින් 38308ක් වූ ආධුනිකයින් වෘත්තීය පරීක්ෂණයෙන් සමත් වී ඇත 2023 වර්ෂය අවසානයේදී මුළු සහතික පත් 33168ක් පුහුණුව සාර්ථකව අවසන් කළ ආධුනිකයින් වෙත ලබා දීමට හැකි විය.

වගුව 10 : ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධන ප්‍රගතිය

ක්‍රියාකාරකම	2022			2023		
	සංවර්ධිත සංඛ්‍යාව	වලංගු ගත කිරීම් සංඛ්‍යාව	සංශෝධිත සංඛ්‍යාව	සංවර්ධිත සංඛ්‍යාව	වලංගු ගත කිරීම් සංඛ්‍යාව	සංශෝධිත සංඛ්‍යාව
ජාතික නිපුණතා සම්මතයන් සහ විෂයමාලා	17	44	26	22	85	21
ඇගයීම් සම්පත්	2			10		
පුහුණු සම්මත/ පරීක්ෂණ පත්‍රිකාව	9			6		
ඉගෙනීමේ මාර්ගෝපදේශන පෙළ පොත්				1		
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුවේ නයිටා විෂය මාලාව				7		
එකතුව	**28**	**44**	**26**	**46**	**85**	**21**

ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලාහි සංවර්ධනය, වලංගුගත කිරීම හා පුනරීක්ෂණ සිදු කිරීම් සංඛ්‍යාව පෙර වසර හා සැසඳීම මෙම වගුව මඟින් නිරූපනය කෙරේ. එහිදී සමාලෝචිත වර්ෂය තුළදී විවිධ වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර නියෝජනය කරමින් විෂය පාඨමාලා සඳහා ජාතික නිපුණතා සම්මත හා විෂය මාලා 46ක් සංවර්ධනය කර ඇත. ඒ අනුව නිපුණතා සම්මත වලංගු ගත කිරීම් 42ක් මෙම වසරේදී සිදු කර ඇත.

2023 වර්ෂයේ විශේෂ වැඩසටහන් හා තොරතුරු

මෙම වර්ෂය තුළ දී අප ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ දිස්ත්‍රික් මට්ටමින් NVQ පාඨමාලා සාර්ථකව නිමකරන ලද ආධුනිකයින් උදෙසා සහතික පත්‍ර ප්‍රදානය කිරීම රත්නපුර, මාතර, කෑගල්ල හා නුවරඑළිය ආදී දිස්ත්‍රික්කයන් හිදී සාර්ථකව නිමා කරන ලදී. එමෙන්ම අප අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය සහ Outreach ව්‍යාපෘතිය එක්ව නිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද සාත්තු සේවක (Care Giver) සහ භෝජනාගාර සේවක (Waiter) NVQ 3 පාඨමාලා සාර්ථකව අවසන් කළ සිසුන් සඳහා සහතික ප්‍රදානය සිදු කරන ලදී.

RPL ක්‍රමවේදය ඔස්සේ පින්තාරු ශිල්පීන් සඳහා NVQ සහතික පත්‍ර ලබාගැනීමේ අරමුණින් JAT Holdings PLC ආයතනයේ හා රත්නපුර NAITA ආයතනයේ දිස්ත්‍රික් කළමනාකාර සරත් පියතිලක මහතා සහභාගිත්වයෙන් පින්තාරු ශිල්පීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී.

දිවයින පුරා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල සේවයේ යෙදී සිටින මදුරු මර්ධක ක්ෂේත්‍ර සහායකයින් 546 දෙනෙකු සඳහා NVQ 3 වන මට්ටමේ පෙර ඇගයීම් පරීක්ෂණ ආරම්භ කර ඇත. එහි දෙවන අදියර යටතේ ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කවල මදුරු මර්ධක ක්ෂේත්‍ර සහායකයින් 160 දෙනෙකු සඳහා සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්) සුජීව වික්‍රමසිංහ මහතාගේ සහ කාර්ය මණ්ඩලයේ අධීක්ෂණයෙන් නයිටා කැණිමඩල ශ්‍රවණාගාරයේදී පෙර ඇගයීම් පරීක්ෂණ පවත්වන ලදී.

යුධ හමුදාව සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය එක්ව මෙරට වෘත්තීය බර වාහන රියදුරන් විදේශීය ශ්‍රම වෙළඳපොලෙහි රැකියා ගත කිරීම උදෙසා සාමූහික ප්‍රයත්නයක් දැරීම පිළිබඳව ශ්‍රී ලංකා යුධ හමුදාපති ජෙනරල් විකුම් ලියනගේ මහතා සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපති රුචික අමරසේකර මහතා මූලික කටයුතු සැලසුම් කරන ලදී.

ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සඳහා දේශීය හා ගෝලීය තොරතුරු තාක්ෂණ රැකියා වෙළඳපොලට පිවිසීමට පැහැදිලි මාවතක් විවර කරමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (නයිටා) විසින් හඳුන්වා දෙනු ලබන "මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමා" (Diploma in Software Engineering) පාඨමාලාවේ සමාරම්භක උත්සවය ගරු අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැණිමඩල ශ්‍රවණාගාරයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.

NAITA ආයතනයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා මාස 06ක කර්මාන්තගත පුහුණුව ලබාදීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ ICBT ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

විදේශගත වීමට අපේක්ෂා කරන ශ්‍රමිකයින් 1500ක් සඳහා RPL ක්‍රමවේදය යටතේ NVQ සහතික පත්‍ර ලබාදීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සහ ලෝක කම්කරු සංවිධානය (ILO) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මෘදු කුසලතා සංවර්ධනය, තොරතුරු තාක්ෂණ හා පරිගණක කුසලතා සංවර්ධනය, පරිගණක දෘඩාංග කුසලතා සංවර්ධනය වැනි අංශ රැසකට ප්‍රමුඛත්වය ලබාදෙමින් පාසල් අධ්‍යාපනයෙන් පසු රැකියා අපේක්ෂිත පිරිස්, ආබාධිත තරුණ තරුණියන් සහ රැකියාවල නියුතු පිරිස් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමේ අරමුණින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියත් 306 බී 2 දිස්ත්‍රික් සිංහ සියවස් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයත් අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දැනට පවතින පාඨමාලාවන්ගේ අධ්‍යයන හා පුහුණු කටයුතු සංවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා - ජපන් තානාපති කාර්යාලයේ නිලධාරීන්, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) නිලධාරීන්, සහ Toyota Lanka ආයතනයේ නිලධාරීන් සමඟ විශේෂ සාකච්ඡාවක් පවත්වමින් එහි මූලික අදියර ආරම්භ කරනලදී.

ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද S4IG වැඩසටහන මඟින් ස්ථාපිත කරන ලද වෘත්තීය සූපවේදී පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු මධ්‍යස්ථානය නිල වශයෙන් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබාදීම සිදු කරන ලදී.

එමෙන්ම නිපුණතා සම්මත සැකසීම පිළිබඳව අවධානය කිරීමේදී සාම්ප්‍රදායික ඇත්ගොව්වන්ගේ ක්‍රමවේද සම්බන්ධව නිපුණතා සම්මත සැකසීම පිළිබඳව විශේෂ සාකච්ඡාවක් ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ ගරු තැන්පත් නිලංග දෑල බණ්ඩාර මහතාගේ මූලිකත්වයෙන් ආරම්භක අදියර සිදුකිරීම.

පුහුණුවන්නන් පමණක් නොව නයිටා විධායක කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය (Capacity Development) සඳහා ඉදිරියේදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාපති රුවික අමරසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් GIZ නියෝජිත පිරිසක් සමඟ විශේෂ සාකච්ඡාවක් නයිටා මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී. එමෙන්ම විගණන කටයුතු පිළිබඳව නයිටා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ අරමුණෙන් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සම්බන්ධව වැඩසටහනක් පැවැත්වීම, ආයතනයේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන වැඩිදියුණු කිරීම් සහ ඊට අදාළ කරුණු පිළිබඳව යහපත් ප්‍රතිඵල පිළිබඳව ද සේවක මණ්ඩලය දැනුවත් කිරීම.

ඒකාබද්ධ සමාජ වගකීම (CSR) පිළිබඳ ප්‍රකාශය

සේවක සහභාගිත්වයෙන් බක්මහ උළෙල, බැති ගී සරණිය හා බත් දන්සලක් පැවැත්වීම ද මෙම වර්ෂයේ පැවැත්විණි.

2024 වර්ෂය සඳහා වැඩසටහන් හා ඉලක්ක

1. මධ්‍යස්ථාන පාදක පුහුණුව යටතේ ආධුනිකයින් 3,685ක් බඳවා ගැනීම.
2. කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව යටතේ ආධුනිකයින් 19,500ක් බඳවා ගැනීම.
3. ජාතික ආයතන සඳහා ආධුනිකයින් 3,445ක් බඳවා ගැනීම.
4. රැකියාස්ථ පුහුණුව යටතේ ආධුනිකයින් 10,000ක් බඳවා ගැනීම.
5. විශේෂ කර්මාන්ත පුහුණුව යටතේ ආධුනිකයින් 16,275ක් බඳවා ගැනීම.
6. ජාතික වෘත්තීය සුදුසුකම-පෙර ඉගෙනුම් පසු ඇගයීම් ක්‍රමය යටතේ ඇගයීම් 8000ක් ක්‍රියාත්මක කිරීම.
7. ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමවේදය යටතේ ඇගයීම් 2500ක් ක්‍රියාත්මක කිරීම.
8. 2024 වසරෙහි ජාතික නිපුණතා සම්මත සහ විෂයමාලා සංවර්ධනය සඳහා GIS Analyst, Drone Pilot, Radiography Assistant, Logistic Management, Assistant Gemologist, Full Stack Software Developer ඇතුළු තෝරාගත් ක්ෂේත්‍ර කිහිපයක කටයුතු කිරීම සඳහා යෝජනා කරනලදී.
9. පර්යේෂණ හා සංවර්ධන අංශය යටතේ “Identifying the factors affecting for the mismatch between the training delivery and skills demand from the industry” යන මැයෙන් නව පර්යේෂණයක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කිරීම.
10. පෙර ඉගෙනුම් පසු ඇගයීම් ක්‍රමවේදය යටතේ (RPL) ක්‍රමවේදය ඔස්සේ Factory Officer – Tea, Rubber Tapper, Phlebotomist, Dental Nurse Assistant, Ayurvedic Therapist, Physical Fitness Trainer ආදී ක්ෂේත්‍ර කිහිපයක් සඳහා මෙම RPL ක්‍රමවේදය මඟින් NVQ සහතික පත් ලබාදීමට කටයුතු කිරීම සඳහා යෝජනා කරන ලදී.
11. ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණය (NTT) ක්‍රමවේදය මඟින් Nail Technician, Fashionable Hair Dresser yd Hair color Technician යන ක්ෂේත්‍ර සඳහා පරීක්ෂණ පැවැත්වීම.
12. එමෙන්ම අප ජාතික ආයතන වන කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය මඟින් නව අර්ධ කාලීන පාඨමාලා ලෙස 2024 Diploma in Surveying & Geomatics, Higher Diploma in Civil Engineering, Certificate Programme for AutoCAD 2D, Professional Diploma in Surveying Technology, Diploma in CAD & Drafting for Civil Engineering හා Higher Diploma in Civil Engineering Technology & Building Construction යන ක්ෂෙත්‍ර සඳහා පාඨමාලා ආරම්භ කිරීමත්, මෝටර් රථ ඉංජිනේරු තාක්ෂණ ආයතනය විසින් නව අර්ධ කාලීන පාඨමාලා ලෙස Auto Mobile Mechanic , Auto Electrical Technology , Lathe & Milling Machine, Gas Air Conditioning Mechanic, Auto Electrical Technology , Automobile Air Conditioning Mechanic හා Safe, Scientific and Economical Driving Techniques යන ක්ෂේත්‍ර සඳහා ද පාඨමාලා ආරම්භ කිරීමට යෝජනා කර ඇත.
13. තවද කර්මාන්ත කටුබැද්ද ආයතනය මඟින් Industrial Motor control, Lathe Machine Operation, Gas & Electrical Arc Welding, Wood Work Basic Hand Tools with Joints & safe Machine Operation යන නව අර්ධ කාලීන පාඨමාලා ආරම්භ කිරීමට යෝජනා කර ඇත.

වගුව 11 : කාර්ය මණ්ඩල තොරතුරු

රැකියා තනතුර	අනුමත කළ සේවක සංඛ්‍යාව	2023/12/31 දිනට සිටින කාර්ය මණ්ඩලය (ස්ථිර)	2023/12/31 දිනට සිටින කාර්ය මණ්ඩලය (කොන්ත්‍රාත් පදනම)
අධ්‍යක්ෂ ජනරාල්	1	1	-
අධ්‍යක්ෂක	5	3	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	18	14	-
අභ්‍යන්තර විගණක	1	1	-
අධ්‍යක්ෂ / විදුහල්පති	3	2	-
නියෝජ්‍ය විදුහල්පති	6	3	-
කථිකාචාර්ය	49	29	3
දිස්ත්‍රික් නිලධාරි	25	22	-
පුහුණු නිලධාරි	62	36	-
පරිපාලන නිලධාරියා	8	3	-
ලේකම් / නීති නිලධාරි	1	0	-
ගිණුම් නිලධාරියා	6	2	2
අභ්‍යන්තර විගණන නිලධාරි	1	-	-
වාහන අළුත්වැඩියා ඒකකයේ සේවා නිලධාරියා	1	-	-
තත්ත්ව සහතික කිරීමේ නිලධාරියා	4	4	-
ප්‍රසම්පාදන නිලධාරියා	1	1	-
පද්ධති පරිපාලක	1	-	-
දත්ත ගබඩා පරිපාලක	1	-	-
සංඛ්‍යාලේඛනඥ	1	1	-
පරීක්ෂක	462	318	17
උපදේශක	122	51	1
පුස්තකාලයාධිපති	3	-	-
පද්ධති විශ්ලේෂක	3	2	-
ප්‍රවාහන නිලධාරියා	1	-	-
තාක්ෂණ නිලධාරි	1	1	-
භාෂා පරිවර්තක	2	-	-
උපදේශක සහකාර	44	-	-
පොත් තබන්නා	4	1	-
ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණඥ	3	1	-
තාක්ෂණික චිත්‍ර ශිල්පී	3	-	-
සැළසුම් ශිල්පී	1	-	1
රසායනාගාර සහකාර	12	6	-
කළමනාකරණ සහකාර	260	207	18
පරිගණක චිත්‍ර ශිල්පී	2	2	1
නේවාසිකාගාර පාලක	2	-	-
රියදුරු සහ කාර්යාල සහායක	40	31	9
ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු	4	3	0
මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු	2	0	0
පොත් බඳින්නා සහ කපන්නා	4	4	0
නිපුණාකාර්මික ශිල්පී	21	14	0
කාර්යාල කාර්ය සහායක	71	51	17
මුළු එකතුව	**1262**	**814**	**69**

සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු වගුව මඟින් නිරූපණය කෙරේ.එහිදී අප අධිකාරිය මඟින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව 1262කි. 2023 වර්ෂය අවසාන වන විට අනුමත සේවක සංඛ්‍යාවෙන් 65%ක් සම්පූර්ණ කරගනිමින් 814ක් වූ සේවක සංඛ්‍යාවක් අප ආයතනය තුළ සේවයෙහි නිරත වෙමින් පවතී.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා 1990 අංක 20 පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත මගින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට සකස් කර ඇත

ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය විසින් නියම කරන ලද මූල්‍ය නීති සහ රෙගුලාසි, ප්‍රතිපත්ති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල වේ. අපගේ දැනුමට අනුව ගනුදෙනු වල වත්කම් සහ සුළුතාවය පවත්වා ගැනීමට සහ ආරක්ෂා කිරීමට පාලන පද්ධතිය ප්‍රායෝගිකව පවත්වා ගෙන ගොස් ඇත. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූලව සකස් කර ඇති අතර ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය ප්‍රදර්ශනය කරයි.

.....

ඩබ්. රුචික අමරසේකර මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
දිනය : 07/06/2024

.....

ඩී.ආර්. සෝමවර්ධන මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

.....

නිපුන් සමරතුංග මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	සටහන්	2023 (රු.)		2022 (රු.)	
ජංගම නොවන වත්කම්					
දේපල පිරියත හා උපකරණ	2	3,486,229,490.90		2,444,683,684.54	
අස්පෘශ්‍ය වත්කම්	2	40,212,376.08		15,584,752.46	
කෙරිගෙන යන වැඩ	3	71,192,776.20	**3,597,634,643.18**	61,232,419.42	**2,521,500,856.42**
ජංගම වත්කම්					
තොගය	4	72,655,147.63		24,275,812.66	
ලැබිය යුතු දෑ	5	104,621,896.28		131,348,069.29	
තැන්පතු, පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	6	83,249,702.62		48,520,999.64	
කෙටිකාලීන ආයෝජන	7	99,249,247.15		96,185,462.10	
මුදල් හා මුදල් සමාන දෑ	8	290,824,672.12	**650,600,665.80**	212,981,832.33	**513,312,176.02**
මුළු වත්කම්			**4,248,235,308.98**		**3,034,813,032.44**
කොටස් සහ වගකීම්	10				
NAITA අරමුදල		2,561,515,448.77		1,141,688,768.88	
සමුච්චිත අතිරික්තය/(හිඟය)		(347,585,994.85)		(265,990,037.17)	
සමුච්චිත අතිරික්තය අර්ධ කාලීන		-		42,671,516.72	
රජයේ ප්‍රදාන-ප්‍රාග්ධන		7,231,251.52		7,231,251.52	
රජයේ ප්‍රදාන -SSDP		62,789,506.99		62,789,506.99	
විලම්බිත වගකීම්		727,792,742.25		812,473,591.64	
සංචිත	11				
ආධාර ලැබීම්		153,886,950.63		153,886,950.63	
ප්‍රාග්ධන අවශ්‍යතා අරමුදල		11,148,914.78		11,148,914.78	
ඉඩම් පැවරීම - AETI		290,860,815.72		290,860,815.72	
මෝටර් සයිකල් ආදායම් සංචිත/පරිවර්තන අරමුදල		7,415,059.28		7,415,059.28	
මෝටර් රථ ප්‍රත්‍යාගණන සංචිත				95,257,959.29	
අනිවාර්ය අරමුදල		5,902,130.56		5,902,130.56	
ප්‍රත්‍යාගණනය		281,250,155.35	**3,762,206,981.00**	184,113,282.06	**2,549,449,710.90**
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික ප්‍රතිපාදන	12	259,547,425.14	259,547,425.14	256,184,549.12	**256,184,549.12**
ජංගම වගකීම්					
ගෙවිය යුතු	9	226,480,902.84	**226,480,902.84**	229,178,772.42	**229,178,772.42**
මුළු කොටස් සහ වගකීම්			**4,248,235,308.98**		**3,034,813,032.44**

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වන අතර පිටු අංක 7 සිට 19 දක්වා හෙළිදරවු කර ඇත

සහතික කිරීම

1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවයට සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශය සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුය.

මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

W. M. A. K. Weerasekara
Director (Finance)
National Apprentice & Industrial Training Authority

ඩබ්.එම්.ඒ. කේ. වීරසේකර
අධ්‍යක්ෂ (මුදල්)

නිපුන් සමරතුංග
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩබ්. ආර් අමරසේකර
සභාපති /ප්‍රධාන විධායක නිලධාරී

ඩී. ආර්. සෝමවර්ධන
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

	සටහන්	2023 (රු.)	2022 (රු.)
මෙහෙයුම් ආදායම			
විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන	13.1	1,087,500,000.00	1,188,500,000.00
		1,087,500,000.00	1,188,500,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	13.1	3,000,000.00	67,950,000.00
	13.1	**1,090,500,000.00**	**1,256,450,000.00**
අමාත්‍යාංශයේ අනෙකුත් ප්‍රදාන - පුනරාවර්තන	13.2	96,086,282.25	
අමාත්‍යාංශයේ අනෙකුත් ප්‍රදාන - ප්‍රාග්ධන	13.2	3,620,026.57	
	13.2	**1,190,206,308.82**	**1,256,450,000.00**
විනිමය ගනුදෙනු වලින් ලැබෙන ආදායම			
පුනරාවර්තන ආදායම - හුවමාරුව	14	532,606,119.28	256,551,759.49
මුළු ආදායම		**1,722,812,428.10**	**1,513,001,759.49**
මෙහෙයුම් ප්‍රතිඵල			
පුනරාවර්තන ආදායම - විනිමය නොවන	13.2	1,183,586,282.25	1,188,500,000.00
පුනරාවර්තන ආදායම - හුවමාරුව	14	532,606,119.28	256,551,759.49
මුළු පුනරාවර්තන ආදායම (ප්‍රාග්ධන නොවන)		**1,716,192,401.53**	**1,445,051,759.49**
ආදායම - වත්මන් (ප්‍රාග්ධන නොවන)			
පුහුණු ද්‍රව්‍ය	15	11,973,025.13	14,901,561.15
වෙනත් පුහුණු වියදම්	16	267,302,981.95	249,011,364.03
කාර්ය මණ්ඩල වියදම්- පොදුගලික වේතන	17	828,296,312.49	835,468,760.28
කාර්ය මණ්ඩල වියදම්-වෙනත්	18	11,537,282.06	45,763,394.74
ප්‍රවාහන හා සන්නිවේදන	19	83,632,918.35	87,485,755.87
සැපයුම් සහ කාර්යාල අවශ්‍යතා	20	18,638,419.76	18,227,472.65
මුද්‍රණ ද්‍රව්‍ය සහ මුද්‍රණ පිරිවැය	21	25,549,548.27	1,613,529.86
උපකරණ නඩත්තුව	22	25,467,888.80	8,357,623.81
පරිශ්‍ර නඩත්තුව	23	189,771,839.92	161,659,549.36
මූල්‍ය හා වෙනත් වියදම්	24	15,264,260.90	4,569,673.11
අර්ධ කාලීන පාඨමාලා	25	56,825,348.41	-
ව්‍යාපෘති/වැඩසටහන් සම්බන්ධ වියදම්	26	6,607,883.31	-
ශිෂ්‍ය සුබසාධක වියදම් - ජාතික ආයතන	27	9,615,509.78	-
සම්පූර්ණ මෙහෙයුම් වියදම්		**1,550,483,219.13**	**1,427,058,684.86**
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		**165,709,182.40**	**17,993,074.63**
විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදානය (මුදල්)		3,000,000.00	120,579,414.01
විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන, අමාත්‍යාංශය (මුදල්)		3,620,026.57	
විනිමය නොවන ආදායම - විලම්බිත ආදායම්	13.3	84,680,849.39	84,680,849.39
විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදානය (වත්කම්)	13.3	59,162,803.19	12,755,731.58
ක්ෂයවීම් සහ ක්ෂයවීම් වියදම්	28	(397,768,819.23)	(229,293,332.66)
දේපල, කම්හල් සහ උපකරණවල හානි			-
ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ගිණුම්ගත කිරීමෙන් පසු කාලය සඳහා අතිරික්තය/(හිඟය).		**316,172,861.55**	**236,009,069.61**
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		**(81,595,957.68)**	**6,715,736.95**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2023 (රු.)		2022(රු.)	
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය (හිඟය)		(81,595,957.68)		6,715,736.95
ගැලපීම්:				
ක්ෂයවීම් / ක්ෂය කිරීම්	397,768,819.23		229,293,332.66	
කල් දැමූ ආදායම	(84,680,849.39)		(84,680,849.39)	
ලැබුණු ප්‍රාග්ධන ආධාර - හුවමාරු නොවන	(59,162,803.19)		(12,755,731.58)	
වත්කම් බැහැර කිරීමේදී පාඩුව	5,429,432.81		-	
වත්කම් බැහැර කිරීමේ ලාභය	(492,980.83)		(13,683.53)	
බොල් ණය සඳහා ප්‍රතිපාදන - කාර්ය මණ්ඩල ණය			377,797.00	
බොල් ණය සඳහා ප්‍රතිපාදන - විවිධ ණය ගැතියන්	-		(345,970.21)	
FD සහ ඉතිරිකිරීමේ තැන්පතු වලින් ලැබෙන පොලී	(17,228,132.94)		(2,237,367.30)	
NAITA අරමුදලට පෙර වසර ගැලපීම්	(1,261,690.61)		-	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	44,333,507.73		19,240,212.00	
පාරිතෝෂිත ගෙවීම්	(37,391,761.62)		(14,189,499.50)	
වැඩිවීම/(අඩුවීම්.) බඩු තොග	(48,379,334.97)		(12,646,299.14)	
වැඩිවීම/(අඩුවීම්.) ලැබිය යුතු මුදල් වලින්	26,726,173.01		(30,623,922.77)	
වැඩිවීම/(අඩුවීම්.) තැන්පතු, අත්තිකාරම්, කාර්ය මණ්ඩල ණය, පෙර ගෙවීම	(34,728,702.98)		(5,317,156.41)	
වැඩිවීම/(අඩුවීම්.) කෙටි කාලීන ආයෝජන	-		(11,035,939.90)	
වැඩිවීම/(අඩුවීම්.) ගෙවිය යුතු මුදල් වලින්	2,347,983.33	193,279,659.58	30,931,398.48	105,996,320.41
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**111,683,701.90**		**112,712,057.36**
ආයෝජන කටයුතු				
පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(42,175,247.46)		(32,746,962.11)	
ප්‍රාග්ධන ප්‍රගතියේ වැඩ	(3,725,031.00)		(24,158,370.46)	
බැහැර කිරීමේ දේපල පිරියත සහ උපකරණ වෙතින් ඉදිරියට ගෙන ඒම්	492,980.83			
ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුමෙන් ලැබෙන පොලී	14,923,401.00			
ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුමේ ආයෝජනය	(18,930,315.89)			
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්	1,840,000.00			
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**(47,574,212.52)**	-	**(56,905,332.57)**
මූල්‍ය ක්‍රියාකාරකම්				
පොලිය ලැබීම්			(13,499,132.54)	**(13,499,132.54)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය				**(13,499,132.54)**
මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම්.).		64,109,489.38		42,307,592.25
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමානතා		226,715,182.74		184,407,590.49
කාල සීමාව අවසානයේ මුදල් සහ මුදල් සමාන මුදල්		**290,824,672.12**		**226,715,182.74**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම්
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රඳවාගත් ඉපැයුම්	රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	SSDP ප්‍රාග්ධන	විලම්බිත ආදායම් ප්‍රදාන (වගකීම්)	ආධාර ලැබීම්	අර්ධකාලීන ගිණුම්වල ලාභය	යතුරුපැදි ආදායම් සංචිත	අර්ධ කාලීන ප්‍රාග්ධන සංචිත	අර්ධ කාලීන අනිවාර්ය ය සංචිත	AETI ඉඩම් හුවමාරු කිරීමේ ලාභය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	එකතුව
2023 ජනවාරි මස 01 දිනට ශේෂය	1,141,688,768.88	(265,990,037.17)	7,231,251.52	62,789,506.99	812,473,591.64	153,886,950.63	42,671,516.72	7,415,059.28	11,148,914.78	5,902,130.56	290,860,815.72	279,371,241.35	2,549,449,710.90
එකතු කරන්න/අඩු කරන්න: ආරම්භක ශේෂ හුවමාරුව							(42,671,516.72)						(42,671,516.72)
එකතුකිරීම්:ගැලපීම්	42,671,516.72		-		-	-						2,020,914.00	44,692,430.72
නැවත සඳහන් කර ඇති ආරම්භක ශේෂය	1,184,360,285.60	(265,990,037.17)	7,231,251.52	62,789,506.99	812,473,591.64	153,886,950.63		7,415,059.28	11,148,914.78	5,902,130.56	290,860,815.72	281,392,155.35	2,551,470,624.90
GOSL වසර සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන			-										-
ප්‍රාග්ධන අළුත්වැඩියා			-										-
වර්ෂයේ ලාභය		(81,595,957.68)	-										(81,595,957.68)
වර්ෂය තුළ ගැලපීම්	1,377,155,163.17				-	-						(142,000.00)	1,377,013,163.17
නැවත තක්සේරු කිරීමේ ලාභය												-	-
විලම්බිත වගකීමට මාරු කිරීම්			-		-	-							-
විලම්බිත ආදායමට මාරු කිරීම්					(84,680,849.39)								(84,680,849.39)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	2,561,515,448.77	347,585,994.85	7,231,251.53	62,789,506.99	727,792,742.25	153,886,950.46	-	7,415,059.28	11,148,914.78	5,902,130.56	290,860,815.72	281,250,155.35	3,762,206,981.00

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ ආයතනය

1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස සඳහන් කෙරේ) අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.

3. සංසන්දනාත්මක තොරතුරු

පසුගිය වර්ෂයට අදාළ ගිණුම්කරණ අගයන් අදාල වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාළ වන පරිදි නැවත ගලපා ඇත.

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1 සංවිධානයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් භාණ්ඩාරික ප්‍රදාන මත රඳා පවතින අතර එම ප්‍රදාන මුදල් පදනම මත ගිණුම්ගත කර ඇත. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්වලට අදාළ ප්‍රදාන දෙකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ණයක් ලෙස ඉදිරිපත් කෙරේ. ප්‍රාග්ධන වියදම් වර්ෂයේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයට හර කරනු ලැබේ.

4.2 ප්‍රාග්ධන ප්‍රදානය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දී එය කල් දැමූ ආදායමක් ලෙස වාර්තා කිරීම සහ ප්‍රදානය යටතේ අත්පත් කරගත් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂ කිරීම වෙනුවට සමස්ත ආදායම ලෙස සලකනු ලබන අතර, ප්‍රදාන යටතේ උපයාගත් වත්කම් ජීවිත කාලය තුළ ක්ෂය වේ. (SLPSAS 11 සහ LKAS 20 හි විධිවිධාන අනුව).

5. වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 තොග

ඉන්වෙන්ටරි සාමාන්‍යයෙන් පිරිවැයට තක්සේරු කර ඇත. ප්‍රාග්ධනීකරණයට ද්‍රව්‍ය නොවන කෙටි ආයු ස්වභාවයක් ඇති ඉන්වෙන්ටරි අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හරිනු ලැබේ. කෙසේ වෙතත්, පාලනය කිරීමේ අරමුණ සඳහා මෙම අයිතම ඉන්වෙන්ටරි කර ඇති අතර භෞතික පාලනය ක්‍රියාත්මක වේ.

5.2 ලැබිය යුතු

මුළු අයවිය යුතු ප්‍රමාණයන් හෙළිදරවු කර ඇති අතර 2023.12.31 දින වන විට අධිකාරියේ සේවය නොකරන සේවකයින්ගේ අඩමාන සහ බොල් ණය සඳහා 100% ප්‍රතිපාදන ලබා දී ඇත. අභ්‍යන්තර ගනුදෙනු වලින් අයවිය යුතු ණය හැර අනෙකුත් සියලුම ණයකරුවන් සඳහා 5% ප්‍රතිපාදන බොල් සහ අඩමාන ණය ලෙස ප්‍රතිපාදන ගිණුම් පොත් වල ගලපා ඇත.

5.3 දේපල පිරියත උපකරණ

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් ඒවා දේපල, පිරියත සහ උපකරණ ලෙස හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය එහි මිලදී ගැනීමේ මිල සහ වත්කම් එහි අපේක්ෂිත

භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැයකින් සමන්විත වේ. අධිකාරියේ කාර්ය සාධනය ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

මූලික හඳුනාගැනීමෙන් පසු මැනීම සඳහා ඉහත සඳහන් කර ඇති හැර අනෙකුත් වත්කම්වල සම්පූර්ණ පන්තිය සඳහා ආයතනය නැවත තක්සේරු කිරීමේ ආකෘතිය යොදයි. ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන තක්සේරු කිරීම් මත පදනම්ව ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම තීරණය කරනු ලබන අතර අදාළ ලියකියවිලි නොමැතිකම සහ කාල සීමාවන් හේතුවෙන් සම්පූර්ණ වත්කම් පන්තිය සම්පූර්ණ කිරීමට නොහැකි විය.

ස්වාධීන තක්සේරුකරුවන් සහ NAITA හි වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා පත් කරන ලද කමිටුව, සමාන වත්කම්වල වර්තමාන වෙළඳපල මිල පවතින විට, එවැනි වත්කම්වල සාධාරණ වටිනාකම් තීරණය කිරීමේදී එවැනි සාක්ෂි සැලකිල්ලට ගනී. එවැනි දේපල නැවත තක්සේරු කරන ලද ප්‍රමාණයන්ගෙන් ගෙන යනු ලැබේ, පසුකාලීනව සමුච්චිත ක්ෂයවීම් සහ නැවත ඇගයීමේ දිනට පසුව අය කරන ලද සමුච්චිත අලාභ හානිවලට වඩා අඩුය. වත්කමක් නැවත තක්සේරු කරන විට, රැගෙන යන අගයේ යම් වැඩි වීමක් වෙනත් විස්තීරණ ආදායමකින් හඳුනාගෙන ප්‍රති ඇගයීම් සංචිතය යටතේ කොටස්වල එකතු වේ, එය ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රති තක්සේරු කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, කලින් වියදම් කළ අඩුවීමේ ප්‍රමාණයට වැඩි වීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ප්‍රති තක්සේරුවේදී පැන නගින රැගෙන යන අගයේ අඩුවීමක් ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති අතර, එම වත්කමේ පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම අඩුවීමක් වෙනත් විස්තීර්ණ ආදායමකින් හඳුනාගනු ලබන්නේ ඒ සම්බන්ධයෙන් ප්‍රති තක්සේරු කිරීමේ අතිරික්තයේ ඇති ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයකටය. වත්කම් ඕනෑම අතිරික්තයක් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස පිළිගැනේ.

වත්කමක් සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීමේ සංචිතයේ ඉතිරිව ඇති ඕනෑම ශේෂයක්, විශ්‍රාම යාමේදී හෝ වත්කම් බැහැර කිරීමේදී රඳවාගත් ඉපැයීම් වෙත සෘජුවම මාරු කරනු ලැබේ. ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා හෝ ආයතනයේ ඉපැයීමේ ධාරිතාව, කාර්යක්ෂමතාව හෝ ක්‍රියාකාරිත්වයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. වත්කම් රැගෙන යන ප්‍රමාණයෙන් හඳුනාගෙන ඇත.

දේපල, කම්හල් සහ උපකරණ බැහැර කිරීමේදී හෝ මාරු කිරීමේදී හෝ ඒවා භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම් හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැරකිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන ප්‍රමාණය අතර වෙනස ලෙස ගණනය කෙරේ) වත්කම් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "අනෙකුත් මෙහෙයුම් ආදායම" තුළ හඳුනා නොගෙන ඇත.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඩාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, සමාගම විසින් දරනු ලබන, භාවිත කිරීමට බලපත්‍ර ලබා දී ඇති, ඒ ආශ්‍රිත දෘඩාංගවලට අත්‍යවශ්‍ය නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසදායක ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභවලට තුඩු දෙනු ඇතැයි සිතිය හැකි සියලුම

පරිගණක මෘදුකාංග පිරිවැය අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය සහ අඩුවෙන් සමුච්චිත ක්‍රමක්ෂකරණය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් වේ.

ප්‍රාග්ධනීකරණයට දුව්‍ය නොවන කෙටි ආයු ස්වභාවයක් ඇති ඉන්වෙන්ටරි අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හරිනු ලැබේ. කෙසේ වෙතත්, පාලනය කිරීමේ අරමුණ සඳහා මෙම අයිතම ඉන්වෙන්ටරි කර ඇති අතර භෞතික පාලනය ක්‍රියාත්මක වේ.

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකිනි.

වත්කම් කාණ්ඩය	ක්ෂය වීම් අනුපාතය
බදු සමඟ පවතින ඉඩම්	කල් බදු කාලය තුළ
ගොඩනැගිලි	5%
පිරියත හා උපකරණ	10%
ගෘහ භාණ්ඩ , සවිකුරු හා කාර්යාල උපකරණ	10%
පරිගණක උපාංග	25%
මෝටර් රථ	25%
පුස්තකාල පොත්	10%
පුහුණු උපකරණ	10%
අස්පෘශ්‍ය වත්කම්	10%

6. මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන ලෙස අර්ථ දැක්විය හැක.

අතැති මුදල් සහ බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මාර්ගස්ථ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන ලෙස සැලකේ.

7. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ දිනට ඇති සියලුම වගකීම් මුදල් ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර දැනටමත් පවතිනවා යැයි සැලකෙන වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ නොහැක. ඉල්ලුම මත සිදුකළ යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත සිදු කළ යුතු ගෙවීම්, මූල්‍ය ප්‍රකාශයේ වර්තමාන වගකීම් ලෙස සැලකේ. ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසුව සිදුකළ යුතු ගෙවීම් වත්මන්-නොවන වගකීම් ලෙස මුදල් ප්‍රකාශයේ සැලකේ.

8. පාරිතෝෂිත ප්‍රතිපාදන

සියළුම සේවකයින්ට ආරම්භක වර්ෂයේ සිට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන ප්‍රතිපාදන පනතට සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 16 වන වගන්තියට අනුව සේවකයෙකු කෙරෙහි මෙම වගකීම බල පැවැත්වෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විටය.

9. නිශ්චිත දායක සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා ගෙවිය යුතු දායක මුදල්,වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේදී සැලකේ.

අධිකාරිය සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ට නොඅඩු මුදලකින් දායක වේ.

10. ආදායම

රජයෙන් ලද ආධාර, පුනරාවර්තන වියදම් ලෙස ලද දේශීය හා විදේශීය ආධාර සහ අධිකාරියේ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ප්‍රධාන අලුත්වැඩියාවන් සහ ප්‍රාග්ධන වත්කම් වැඩිවීම් සඳහා වියදම් කළ මුදල් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ප්‍රාග්ධනිත කර

නොමැති අතර සමාන මුදලක් ප්‍රාග්ධන ප්‍රදානවලින් මාරු කර ඇත.

ස්ථාවර වත්කම්වල හඳුනාගත් වගකීම් සහ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු අතිරික්තය/හිඟය හෝ වියදමට වඩා වැඩි ආදායම ඇති විය.

අධිකාරිය ක්‍රියාත්මක කිරීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී සිදුවන වියදම් අයභාරගත කර ඇත.

11. ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම්

සියළු ද්‍රව්‍යමය ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

12. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්


ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත.


13. මුදල් ප්‍රවාහ ප්‍රකාශය


විලම්භිත ආදායම් අඩුවීම්/වැඩිවීම් මුදල් නොවන සංචලනයන් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත.


පෙර වසරවල මූල්‍ය විශේෂ අවස්ථා

	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
රජයේ ප්‍රදාන - පුනරාවර්තන	685,000,000.00	768,000,000.00	904,645,000.00	1,175,060,000.00	1,161,995,000.00	1,083,500,000.00	1,093,500,000.00	1,188,500,000.00	1,087,500,000.00
ස්වයං ජනනය කරන ලද ආදායම - වෙනත් ආදායම්	67,354,991.71	72,034,104.41	84,823,081.48	75,623,487.49	97,493,599.90	55,559,579.48	78,309,067.10	148,583,986.67	522,490,782.08
පුහුණු සම්බන්ධ වියදම් (සෘජු)	94,044,974.14	92,702,284.14	150,091,924.26	247,766,374.97	150,768,898.25	77,721,986.60	147,935,464.17	237,606,197.20	279,378,385.91
වෙනත් මෙහෙයුම් වියදම්	849,008,383.72	1,988,806,886.51	1,108,983,620.51	1,206,693,785.30	1,454,706,777.74	1,236,972,539.42	1,272,724,304.65	1,431,000,939.46	1,668,237,390.98
දළ ලාභ අනුපාතය	80.37	70.64	75.43	77.17	80.40	88.55	82.67	76.33	52.83
ශුද්ධ ලාභ අනුපාතය	(15.40)	(35.43)	(0.14)	1.15	(13.92)	(3.74)	(4.40)	0.43	(4.74)
වත්මන් අනුපාතය	2.72 : 1	2.19 : 1	0.84 : 1	1.20 : 1	1.02 : 1	1.39 : 1	1.68 : 1	1.82 : 1	2.43 : 1
ඉක්මන් අනුපාතය	2.61 : 1	2.07 : 1	0.79 : 1	1.14 : 1	0.96 : 1	1.33 : 1	1.62 : 1	1.71 : 1	2.33 : 1
වත්කම් මත ප්‍රතිලාභ	(9.89)	(34.57)	(0.11)	1.03	(5.79)	(1.38)	(1.96)	0.22	(1.92)


පුනරාවර්තන ප්‍රදාන
1,400,000,000.00
1,200,000,000.00
1,000,000,000.00
800,000,000.00
600,000,000.00
400,000,000.00
200,000,000.00
0.00
2015
2016
2017
2018
2019
2020
2021
2022
2023


ස්වයං ජනනය කරන ලද ආදායම
600000000
500000000
400000000
300000000
200000000
100000000
0
2015
2016
2017
2018
2019
2020
2021
2022
2023


පුහුණු සම්බන්ධ වියදම් (සෘජු)
300000000
250000000
200000000
150000000
100000000
50000000
0
2015
2016
2017
2018
2019
2020
2021
2022
2023


වෙනත් මෙහෙයුම් වියදම්
2,500,000,000.00
2,000,000,000.00
1,500,000,000.00
1,000,000,000.00
500,000,000.00
0.00
2015
2016
2017
2018
2019
2020
2021
2022
2023

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
විගණන කමිටු වාර්තාව - 2023

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු ආයතනයක අභ්‍යන්තර පාලනයන්, එහි ආයතනික භාවිතයන්, ක්‍රියාවලි සහ ක්‍රමවේද ඇගයීම සඳහා වූ ස්වාධීන සේවාවක් වන අතර එය සංවිධානයට අදාල වන විවිධ නීතිවලට අනුකූල වීම සහතික කිරීමට උපකාරී වේ.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස අභ්‍යන්තර විගණක, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලබයි.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම - 2023 වර්ෂය

සංයුතිය

සමාලෝචිත වර්ෂය තුල කමිටුවේ සාමාජිකයන් පහත පරිදි විය.

සභාපති

I. එම්.ඒ.එස්.මධුශංක මයා (2023 වර්ෂය පළමු කාර්තුව, දෙවන කාර්තුව, තෙවන කාර්තුව) කමිටු සභාපති/ මුදල් අමාත්‍යංශ නියෝජිත
II. එම්.කේ. සිතාරා ජයසේන මිය (2023 වර්ෂය සිව්වන කාර්තුව) කමිටු සභාපති/ මුදල් අමාත්‍යංශ නියෝජිත

සාමාජිකයින්

I. අයි.එස්.එන්. පෙරේරා මයා - කමිටු සාමාජික/ පාලක මණ්ඩල සාමාජික
II. ආචාර්ය කාංචන සිල්වා මයා - කමිටු සාමාජික/ පාලක මණ්ඩල සාමාජික
III. ජයන්ත වික්‍රමසිංහ මයා - කමිටු සාමාජික/ පාලක මණ්ඩල සාමාජික
IV. එච්.ඩී. අනුරුද්දිකා මිය - කමිටු සාමාජික/ පාලක මණ්ඩල සාමාජික/ රේඛීය අමාත්‍යංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක
V. චමිලා අහේධීර මිය - නිරීක්ෂක - ජාතික විගණන කාර්යාලය

නම	සහභාගී වූ රැස්වීම් ගණන (2023 වර්ෂය)	2023 වර්ෂයේ පැවති මුළු රැස්වීම්
එම්.ඒ.එස්.මධුශංක මයා	03	04
එම්.කේ. සිතාරා ජයසේන මිය	01	
අයි.එස්.එන්. පෙරේරා මයා	02	
ආචාර්ය කාංචන සිල්වා මයා	03	
ජයන්ත වික්‍රමසිංහ මයා	04	
එච්.ඩී. අනුරුද්දිකා මිය	04	
චමිලා අහේධීර මිය	04	

ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී හා රේඛීය අමාත්‍යංශ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස රැස්වීම සඳහා සහභාගී වූ අතර අධිකාරියේ සභාපති, උපසභාපති, සියලුම අධ්‍යක්ෂකවරු හා ජාතික ආයතනයන්හී විදුහල්පතිවරු ඔවුන් වෙත කරණු ලබන ආරාධනය අනුව රැස්වීමට සහභාගී විය.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

පළමු කාර්තුව	දෙවන කාර්තුව	තෙවන කාර්තුව	සිව්වන කාර්තුව
කොළඹ දිස්ත්‍රික් කාර්යාලයේ 2020 වර්ෂය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ වල පැවති අඩිපාඩු සම්බන්ධව	අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද එස්.පී. විජේවන්ත මහතාගෙන් අයකර ගත යුතු මුදල් සම්බන්ධව	අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද එස්.පී. විජේවන්ත මහතාගෙන් අයකර ගත යුතු මුදල් සම්බන්ධව	අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද එස්.පී. විජේවන්ත මහතාගෙන් අයකර ගත යුතු මුදල් සම්බන්ධව
අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලද එස්.පී. විජේවන්ත මහතාගෙන් අයකර ගත යුතු මුදල් සම්බන්ධව	SSDP ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.29,980,878.98 ක නිරවුල් නොවූ ණයගැති ශේෂය සම්බන්ධව	SSDP ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.29,980,878.98 ක නිරවුල් නොවූ ණයගැති ශේෂය සම්බන්ධව	SSDP ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.29,980,878.98 ක නිරවුල් නොවූ ණයගැති ශේෂය සම්බන්ධව
SSDP ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.29,980,878.98 ක නිරවුල් නොවූ ණයගැති ශේෂය සම්බන්ධව	වාර්ෂික තොග සමීක්ෂණය සම්බන්ධව	වාර්ෂික තොග සමීක්ෂණය සම්බන්ධව	වාර්ෂික තොග සමීක්ෂණය සම්බන්ධව
වාර්ෂික තොග සමීක්ෂණය සම්බන්ධව	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
ඔරුගොඩවත්ත මෝ.ඉ.අ. ආයතනයේ ඉන්වෙන්ට්‍රි පොත අස්ථානගත වීම සම්බන්ධව	ඔරුගොඩවත්ත යකඩ සම්බන්ධව	ඔරුගොඩවත්ත යකඩ සම්බන්ධව	ඔරුගොඩවත්ත යකඩ සම්බන්ධව
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	හොරදුගොඩ ඉඩම සම්බන්ධව	හොරදුගොඩ ඉඩම සම්බන්ධව	හොරදුගොඩ ඉඩම සම්බන්ධව
ඔරුගොඩවත්ත යකඩ සම්බන්ධව	කටුනායක ඉ.තා.ආයතනයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විගණන විමසුමේ සඳහන් DEMP ව්‍යාපෘතිය වෙනුවෙන් අයකර ආපසු නොගෙවා 2013 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් වල ඇති රු. 1,267,300.09 ක මුදල් සම්බන්ධව	කටුනායක ඉ.තා.ආයතනයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විගණන විමසුමේ සඳහන් DEMP ව්‍යාපෘතිය වෙනුවෙන් අයකර ආපසු නොගෙවා 2013 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් වල ඇති රු. 1,267,300.09 ක මුදල් සම්බන්ධව	කටුනායක ඉ.තා.ආයතනයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විගණන විමසුමේ සඳහන් DEMP ව්‍යාපෘතිය වෙනුවෙන් අයකර ආපසු නොගෙවා 2013 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් වල ඇති රු. 1,267,300.09 ක මුදල් සම්බන්ධව
හොරදුගොඩ ඉඩම සම්බන්ධව	කටුබැද්ද ප්‍රදර්ශනාගාරය සම්බන්ධව	කටුබැද්ද ප්‍රදර්ශනාගාරය සම්බන්ධව	කටුබැද්ද ප්‍රදර්ශනාගාරය සම්බන්ධව

පළමු කාර්තුව	දෙවන කාර්තුව	තෙවන කාර්තුව	සිව්වන කාර්තුව
කටුනායක ඉ.තා.ආයතනයට අදාලව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති විගණන විමසුමේ සඳහන් DEMP ව්‍යාපෘතිය වෙනුවෙන් අයකර ආපසු නොගෙවා 2013 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් වල ඇති රු. 1,267,300.09 ක මුදල් සම්බන්ධව	රේඛීය අමාත්‍යංශයෙන් ලද බිලියන 1.9 ක් වටිනා පුහුණු උපකරණ සම්බන්ධව	රේඛීය අමාත්‍යංශයෙන් ලද බිලියන 1.9 ක් වටිනා පුහුණු උපකරණ සම්බන්ධව	රේඛීය අමාත්‍යංශයෙන් ලද බිලියන 1.9 ක් වටිනා පුහුණු උපකරණ සම්බන්ධව
කටුබැද්ද ප්‍රදර්ශනාගාරය සම්බන්ධව			
රේඛීය අමාත්‍යංශයෙන් ලද බිලියන 1.9 ක් වටිනා පුහුණු උපකරණ සම්බන්ධව			

- අභ්‍යන්තර විගණන විමසුම් වලින් හඳුනාගත් විශේෂ කරුණු

දෙවන කාර්තුව	අධිකාරියට අයත් සියළුම වාහන පරීක්ෂා කිරීම
තෙවන කාර්තුව	මුද්‍රණ අංශය - කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය
සිව්වන කාර්තුව	ඉංජිනේරු තාක්ෂණ ආයතනය - කටුනායක

- අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව ඉදිරිපත් කිරීම

එස්.එස්. මාතරආරච්චි
අභ්‍යන්තර විගණක

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/D/NAITA/1/2023/41 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 සැප්තැම්බර් 19 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළ්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා ගාස්තු ආදායම තුල ඇතුළත් ඉදිරි වර්ෂවලට අදාල රු.123,980,669 ක ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා කලින් ලද ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් පාරිතෝෂික වෙන් කිරීමේදී සේවකයන් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන තිබුණි. එහිදී සේවකයන්ගේ සේවා කාලය හා වැටුප නිවැරදිව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන්කිරීම රු.15,063,462 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 96 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් වර්ෂ 3 ක ඵලදායී ජීව කාලයක් සහිත 2021 දෙසැම්බර් 03 මිලදීගෙන තිබූ පිරිවැය රු.2,170,800 ක් වූ පරිගණක ප්‍රතිවෛරස් මෘදුකාංග වර්ෂයකට සියයට 10 බැගින් ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් හා අනෙකුත් අස්පෘෂ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයට අදාළව ක්‍රමක්ෂය වියදම් පිළිවෙළින් රු.1,146,479 කින් හා රු.13,537,537කින් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.1,146,476ක් අඩුවෙන්ද අස්පෘෂ්‍ය වත්කම් ගිණුමේ ශේෂය රු.14,684,016කින් හා සමුච්චිත අතිරික්ත ගිණුමේ ශේෂය රු.13,537,537කින් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනයේ පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ අමාත්‍යාංශය විසින් පුහුණු උපකරණ භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා 2021 වර්ෂයේදී වැය කරන ලද රු.68,483,520ක් අදාළ උපකරණ හා වත්කම් ගිණුම්වලට ප්‍රාග්ධනිත කළ යුතු වුවත් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් පුහුණු උපකරණ ගිණුමේ ශේෂය සහ ගොඩනැගිලි ගිණුමේ ශේෂය එම අගයෙන් පිළිවෙළින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත්, ලී බඩු හා කාර්යාල උපකරණ, පරිගණක උපාංග හා පුහුණු උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය පිළිවෙලින් රු.183,689 ක්, රු.17,337,769 ක්, රු.58,120,905 ක් හා රු.101,316,642 ක් ලෙස දක්වා තිබුණද විගණනයේදී සිදුකළ ගණනය කිරීම් අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.1,085,846 ක් රු.15,157,964 ක්, රු.61,072,840 ක් හා රු.90,661,425 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම් රු.8,980,930 ක් වැඩියෙන් දක්වා

තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය හා ස්ථාවර වත්කම් රු.8,980,930ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු කාර්යසාධන දීමනා රු.5,406,178 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ලැබිය යුතු කාර්යසාධන දීමනා එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයට අදාල නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වියදම් රු.29,080,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීමෙන් හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතුව තිබූ ශිෂ්‍යාධාර රු.44,526,000 ක් ආදායම් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.73,606,000 ක් වැඩියෙන් ද සමුච්චිත අරමුදල රු.29,080,000 ක් වැඩියෙන් හා ලැබිය යුතු ශිෂ්‍යාධාර ආදායම් රු.44,526,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2023 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු ශේෂය 2,929,000 ක් වුවද කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.10,766,575ක් වූයෙන් එම ශේෂ අතර රු.7,837,575 ක නොසැසඳීමක් පැවතුණි.

(එ) කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලා හදාරනු ලබන සිසුන්ගේ සුභසාධන කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අයකර තිබුණු රු.2,456,000 ක් අදාල අරමුදල් ගිණුමට බැර කිරීම වෙනුවට අධිකාරියේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා සුභසාධන අරමුදල් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.38,281,274ක් මුදල් ගලායෑම් ලෙස දැක්විය යුතු වුවත් එය රු.42,175,247ක් ලෙස දැක්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.3,893,973ක් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනය සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ

- අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මාගේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(I)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති (අා) සහ (උ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 15(1) වගන්තිය	අධිකාරියේ ජාතික ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අර්ධ කාලීන පාඨමාලා 37 න් කිසිදු පාඨමාලාවක් කොමිෂන් සභාවේ ලියාපදිංචි කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396(අ) වගන්තිය	නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකර මාස 06ක කාලයක් ඉකුත්වූ එකතුව රු.1,298,541 ක් වටිනාකමැති වෙක්පත් 72 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක 02/2015 හා 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	දුරකථන දීමනාව හිමි නොමැති මාණ්ඩලික නොවන තනතුරු දරන නිලධාරීන් වෙත ලබා දී තිබූ දුරකථන සම්බන්ධතා වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.6,462,922 ක් මාසික බිල්පත් වශයෙන් මොබිටෙල් (පුද්ගලික) සමාගම වෙත ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2 කොටසේ vi පරිච්ඡේදයේ 37(උ) වගන්තිය	වෘත්තිය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුලදී කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) හා 5.4.10(ආ) වගන්තිවලට පටහැනිව සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව හා කාර්යසාධන සුරක්ෂණය ලබා ගැනීමකින් තොරව 2023 දෙසැම්බර් 13 දින Desk top පරිගණක 30 ක් මිලදී ගැනීම සඳහා රු.8,025,000 ක් වැය කර තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති වටිනාකම තුළ ඇතුළත් රු.73,804,932ක් වූ පුහුණු උපකරණ 2024 අගෝස්තු 16 දින දක්වාම කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබී නොතිබුණි. තවද වටිනාකම රු.87,588,591ක් වූ පුහුණු උපකරණ හාවිතයට ගතහැකි වන පරිදි ස්ථාපිත නොකිරීම සහ එම උපකරණ හාවිතයට ගැනීමට අවශ්‍ය අනෙක් උපකරණ නොලැබීම හේතුවෙන් වසර 02කට අධික කාලයක සිට ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වාර්ෂිකව සිසුන් 100කට අධික සංඛ්‍යාවක් බඳවාගෙන තිබූ සිවිල් ඉංජිනේරු අංශය වෙත ඉහත (අ) හි සඳහන් ව්‍යාපෘතිය මඟින් රු.286,330,412 ක ඉන්වෙන්ට්‍රිගත හා ඉන්වෙන්ට්‍රිගත නොවන උපකරණ ලැබී තිබුණද 2022 හා 2023 වර්ෂ සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 41ක් හා 18 ක් දක්වා අඩු වී තිබීම තුලින් මෙම ඉහල වටිනාකමැති පුහුණු උපකරණ උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි උපයෝජනය කර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයේදී සිසුන් 70 ක් බඳවා ගෙන තිබූ Mechanical General Engineering පාඨමාලාව සඳහා 2021 වර්ෂයේදී රු.661,111,008 ක වටිනා උපකරණ ලැබී තිබුණද මෙම උපකරණ

ඵලදායිව උපයෝජනය කිරීමට කටයුතු සැලසුම් කර නොතිබීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂයන්හිදී ඇතුලත්ව තිබුණු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 31 ක් හා 25 ක් විය. ඒ අනුව 2020 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සිසුන් බඳවාගැනීම් සියයට 64 කින් අඩු වී තිබුණි.

(ඇ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් අධිකාරිය වෙත ලබා දී තිබූ 2021 වර්ෂයේ සිට පැවත එන රු.7,699,518 ක් අදාල ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට භාවිතා කර නොතිබූ අතර ඉන් රු.7,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මඟින් අධිකාරිය වෙත ලබා දීමට එකඟ වී තිබූ එහෙක් 2014 වර්ෂයේදී සිදුකරන ලද ප්‍රසම්පාදන අක්‍රමිකතාවයක් හේතුවෙන් රු.මිලියන 29 ක් අනිම් වී තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අධිකාරිය විසින් මිලදී ගැනීමේ හා වෙනත් අවශ්‍යතා වෙනුවෙන් බාහිර පාර්ශවයන් 89 දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.6,685,455 ක මුදල් අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) අධිකාරියේ සේවයෙන් ඉවත්වී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,592,757ක ණය හා අත්තිකාරම් එම නිලධාරීන් සේවයෙන් ඉවත්වන අවස්ථාවේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියට අයත් ජාතික ආයතන 03 මඟින් ආධුනික සිසුන්ගෙන් ශිෂ්‍ය සුභසාධන අරමුදලට අයකරනු ලබන මුදල් සුබසාධක කටයුතු සඳහා යෙදවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.48,995,619ක් ආයෝජනය කර තිබුණි.

(එ) අධිකාරියට අයත් ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු පුහුණු ආයතනයේ සිසුන්ගෙන් ආපසු ගෙවීමේ පදනම මත පෙර වර්ෂවලදී අයකරගෙන තිබුණු එකතුව රු.7,024,147 කින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු මුදලක් නැවත සිසුන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 1990 අංක 20 දරන කෘතියික හා වෘත්තිය අධ්‍යාපන පනතෙහි අරමුණු වලින් බැහැරව විධිමත් අනුමැතියකින්ද තොරව පුද්ගලයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් 2022 මාර්තු 16 දින NAITA Foreign Employment (Pvt) Ltd නමින් පෞද්ගලික සමාගමක් පිහිටුවා ගෙන තිබුණි. පුද්ගලයන් 121 දෙනෙකුගෙන් ලබාගත් රු.1,270,500ක් අධිකාරියේ බැංකු ගිණුමට බැර කර ඉන් විධිමත් පත්වීමක් නොමැති පුද්ගලයෙකුට වැටුප් හා ඉන්ධන දීමනා ගෙවීම සඳහා

රු.402,955 ක් ද විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි කිරීම් සඳහා රු.448,000 ක් ද වැයකර තිබුණි.

(ඔ) අධිකාරියේ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පුහුණු කටයුතු සඳහා යෝග්‍ය නොවන තෙවන පාර්ශවයක් විසින් ආනයනය කරන ලද අධි ධාරිතාවයකින් යුතු මෝටර් රථයක් නිදහස් කර ගැනීමට රේඛීය අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව 2017 වර්ෂයේදී අධිකාරිය විසින් රේගු, වරාය හා නිෂ්කාශන ගාස්තු ලෙස රු.16,510,115 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම රථය පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

(ඕ) අධිකාරියට අයත් මුද්‍රණ අංශයක් තිබියදී හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 , 3.6.1(අ) සහ (ආ) වගන්ති වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී බාහිර ආයතන මඟින් අධිකාරියට අවශ්‍ය පොත් මුද්‍රණය සඳහා රු.4,033,750 ක් වැයකර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති